


# චලන චිත්‍රය

# චලන චිත්‍රය

## ( 'නිවනේ නිවීම' දෙසුම් පෙළ ඇසුරිනි )

**ISBN 955 - 98864 - 3 - 6**

පොත්ගුල්ගල ආරණ්‍ය සේනාසනය
'පහන් කණුව'
කන්දේගෙදර,
දේවාලේගම.

ප්‍රකාශනය
ධර්මග්‍රන්ථ මුද්‍රණභාරය

**2008**

ධම්මදානයකි
මුදලට විකිණීම සපුරා තහනම් වෙයි.

ප්‍රථම මුද්‍රණය - 2004 නොවැම්බර්
දෙවන මුද්‍රණය - 2005 ජුලි
තෙවන මුද්‍රණය - 2008 පෙබරවාරි

පොත ලබාගත හැකි ස්ථාන

1. පොත්ගුල්ගල ආරණ්‍ය සේනාසනය
   'පහන් කණුව' කන්දේගෙදර, දේවාලේගම.
2. රෝයල් ඉන්ස්ටිටියුට්,
   191, හැව්ලොක් පාර, කොළඹ 5.
3. ඩී.ටී. වේරගල මහතා
   422, වැලිපාර, තලවතුගොඩ
4. අනුර රූපසිංහ මහතා
   27, කොළඹ වීදිය, මහනුවර.
5. හේමා රූපසිංහ මිය
   26, හැව්ලොක් පාර, ගාල්ල.
6. මහා භාරකාර දෙපාර්තමේන්තුව
   2, බුලර්ස් පටුමග, කොළඹ 07.

වෙබ් අඩවිය : www.seeingthroughthenet.net

*මුද්‍රණය*
කොලිටි ප්‍රින්ටර්ස්
17/2, පැඟිරිවත්ත පාර, ගංගොඩවිල,
නුගේගොඩ.
ටෙලි : 011-4870333

# චලන චිත්‍රය ගැන..........

තිලෝගුරු සම්මා සම්බුදු පියාණන් වහන්සේ විසින් සුදේශිත ධම්ම පද පුෂ්පයන් රැස්කර තැනූ අපගේ 'නිවන' දෙසුම් මල්දම මුද්‍රිත පිටු 700 ද ඉක්මවා දිවෙන 'නිවනේ නිවීම' නම් වූ වෙළුම් එකොළොසක ග්‍රන්ථ මාලාවක් බවට පත් වී ඇත. ඒ ග්‍රන්ථ මාලාව කියවීමට අවකාශ නොමැති ශ්‍රද්ධා බුද්ධි සම්පන්න ධර්මකාමීන්ට සීමිත අර්ථයකින් හෝ එහි සාරාංශයක් බඳු වූ මේ 'චලන චිත්‍රය' තුළින් දෙසුම් පෙළෙහි අන්තර්ගතය පිළිබඳව 'පෙරදැක්මක්' ලැබිය හැකිය.

'නිවනේ නිවීම' ග්‍රන්ථමාලාවේ ඒ ඒ තැනින් උපුටා ගත් ධම්මපද පුෂ්පයන් සීරුවෙන් ගලපා බැති සිතින් මෙම චලන චිත්‍ර මල්දම ගෙතූ මහනුවර පුෂ්පදාන බාලිකා විදුහලේ ආචාරිණී මාලිනී ආරියරත්න මහත්මියටත් ඒ මහත්මියගේ පරලෝසැපත් මෑණියන් ඇතුළු ඥාතීන්ටත් අපගේ විශේෂ අවසරය ඇතිව සිදු කැරෙන මේ ධර්මදානයෙන් ජනිත කුශලය නිවනේ නිවීම පිණිස උපනිශ්‍රය සම්පතක්ම වේවායි පතමු.

මෙයට

සසුන් ලැදි,

**කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු**

පොත්ගුල්ගල ආරණ්‍ය සේනාසනය

'පහන් කණුව'

කන්දෙගෙදර

දේවාලේගම

(2548) 2004 ජුලි 23



# චලන චිත්‍රය
# (තෙවන මුද්‍රණය)

මහනුවර හීරැස්සගල අංක 197/8A හි නිවැසි මාලිනී ආරියරත්න මහත්මිය, පිටපත් 2000 ක් වන මෙම තෙවන මුද්‍රණය සිය පරලෝසැපත් දෙමව්පියන්ට පින් පිණිස එළිදක්වීමට ඉදිරිපත් වූ අතර අප පාඨකයින්ගේ සුඛාවබෝධය තකා මෙවර මුද්‍රණය විශේෂ වෙහෙසක් දරා තවදුරටත් සකස් කළ බැවින් ධර්ම දානමය කුශලය ඒ මහත්මියටත්, එම දෙමව්පියන්ටත් "නිවනේ නිවීම" පිණිස උපනිශ්‍රය සම්පතක්ම වේවායි පතමු.

**සම්පාදක**

**(2551) 2007 සැප්තැම්බර්**

# ප්‍රකාශක නිවේදනය

අතිපූජ්‍ය කටුකුරුන්දේ ඤාණනන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ "නිවනේ නිවීම" දේශනා මුද්‍රණය කොට, ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයහට එම දහම් පොත් ලබාදීමේ මූලික අදහස අප තුළ ඇතිවී මුත්, මුද්‍රණය සඳහා වැය වන මුදල උපයා ගැන්ම ප්‍රශ්නයක් විය. එය විසඳීම පිණිස අප කිහිප දෙනෙක් යෝජනා කළේ වැයවන මුද්‍රණ වියදම පමණක් අය කර ගැන්මට ප්‍රමාණවත් වූ මිලකට එම දහම් පොත් විකිණීමයි. එහෙත්, අපගේ එම යෝජනාව ගරු ඤාණනන්ද ස්වාමීන් වහන්සේ එකහෙලා ප්‍රතික්ෂේප කරමින් "ධර්මය මිල කරන්න බැහැ. එය අවශ්‍ය අයහට නොමිලේ ලබා ගැන්මට හැකිවිය යුතුයි...." කීහ.

එබැවින් උන්වහන්සේ අදහස් කළ පරිදි මුලින්ම මුද්‍රණය කළ "නිවනේ නිවීම" දේශන මාලාව සඳහා වියදම් ලබා ගැන්මේ වැඩ පිළිවෙලක් වශයෙන් රෝයල් ඉන්ස්ටිටියුට් හි අධිපති ජී.ටී.බණ්ඩාර මහතා විසින් මහා භාරකාර දෙපාර්තමේන්තුවෙහි "ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය" නමින් අරමුදලක් අරඹනු ලැබීය. එවකට මහා භාරකාර ධූරය දැරූ යූ. මාපා මහතාගේ අදහසක් අනුව පිහිටුවන ලද එකී භාරයෙහි අරමුණ වූයේ මෙම පුණ්‍ය ක්‍රියාව ඉටුකර ගැනීම සඳහා දායක වීමට කැමති අයහට මුදලින් කෙරෙන තම පුණ්‍යාධාර එම භාරයට බැර කිරීමට අවස්ථාව සළසා දීමයි.

1997 වසරේදී ඇරඹුණු මෙම ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය මගින් පූජ්‍ය ඤාණනන්ද හිමියන්ගේ දේශනා 33 කින් යුත් "නිවනේ නිවීම" වෙළුම් 11 කින් මුද්‍රණය කොට නොමිලේ බෙදා දීමට අමතරව පසළොස්වක පොහෝ දිනයන්හිදී පහන් කණුව සෙනසුන වෙත රැස්වෙන උපාසක උපාසිකාවන් සඳහා උන්වහන්සේ විසින් කෙරෙන ධර්ම දේශනා "පහන් කණුව ධර්ම දේශනා" නමින් මේ වන විට ග්‍රන්ථ 5ක් පළකොට තිබේ. එතැනින් නොනැවතී උන්වහන්සේගේ අනෙකුත් සිංහල සහ ඉංග්‍රීසි ග්‍රන්ථ එසේම ධර්ම දාන වශයෙන් පළකිරීමට හැකිවීම ඊට දායක වූ අප සැමගේ ඉමහත් සතුටට හේතුවිය.

අති පූජ්‍ය ඤාණනන්ද ස්වාමීන් වහන්සේගේ එම ධර්ම දේශනා අගයමින් එම සත්කාර්යය නොනවත්වා කරගෙන යෑම පිණිස දායක භවතුන්ගෙන් අප වෙත ලැබෙන පැසසුම් සහිත ප්‍රතිචාරය නිසාම ඒ අයගේ පහසුව පිණිස අප විසින් මෑතකදී "ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය" නමින් සම්පත් බැංකුවේ නුගේගොඩ ශාඛාවේ අංක 0003 6000 1415 දරණ ජංගම ගිණුම විවෘත කරන ලදී.



අති පූජ්‍ය කටුකුරුන්දේ ඤාණනන්ද හිමියන් විසින් පහදා දෙනු ලබන නිර්මල බුදු දහම ඔබ අතට පත් කිරීම අපගේ එකම අරමුණයි. ඊට ඔබගෙන් ලැබෙන දායකත්වය ඉමහත් කුශලයකි. අපට ඉමහත් ධෛර්යයකි.

මෙම වටිනා ග්‍රන්ථ මුද්‍රණය කොට බෙදා හැරීමේ සම්පූර්ණ කාර්යභාරය ජී.ටී. බණ්ඩාර මහතා විසින් රෝයල් ඉන්ස්ටිටියුට් හි පින්වත් නිලධාරීන්ගේ සහායද ඇතිව වෙහෙස මහන්සි නොබලා ඉටුකර දීම ගැන අපගේ බලවත් ප්‍රසාදය මෙහිලා විශේෂයෙන්ම සඳහන් කළයුතු වේ.

මෙයට,
සසුන් ලැදි
ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරකාර මණ්ඩලය

2, බුලර්ස් පටුමග
කොළඹ 07.
1997 ජුලි 1

# ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය මගින් පළකැරෙන ග්‍රන්ථ මුද්‍රණයට දායක වීම

අති පූජ්‍ය කටුකුරුන්දේ ඤාණනන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් දේශිත නිර්මල බුදු දහම, "නිවනේ නිවීම" සහ "පහන් කණුව ධර්ම දේශනා" නමින් පළ වී ඇති දහම් පොත් තුළින් මේ වන විටත් ඔබ ඇතැම් විට කියවා තිබිය හැක.

එම ස්වාමීන් වහන්සේගේ ධර්ම දේශනා හැකි පමණ මුද්‍රණය කොට නොමිලේ බෙදා දීම ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරයේ අරමුණයි.

මෙතෙක් එම භාරය මගින් පළකොට ඇති ධර්ම ග්‍රන්ථ එකී ග්‍රන්ථ වල අවසාන පිටුවෙහි දක්වා ඇත.

මෙම මහඟු පුණ්‍ය ක්‍රියාව සඳහා දායක වීමට කැමති පින්වතුන්, පහත සඳහන් උපදෙස් පිළිපැදීම මැනවි.

1. චෙක්පත්/මුදල් ඇනවුම් මගින් එවන සියලු ආධාර "ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය" නමින් සම්පත් බැංකුවේ නුගේගොඩ ශාඛාවේ අංක 0003 6000 1415 දරණ ගිණුමට බැර කිරීම පිණිස පහත සඳහන් ලිපිනයට එවිය හැකිය.
2. දිවයිනේ පිහිටි ඕනෑම සම්පත් බැංකු ශාඛාවක් මගින් ඔබගේ ආධාර මුදල් ඉහත සඳහන් ගිණුමට බැර කල හැක.
3. කෙසේ වුවද, ඔබගේ පහසුව පිණිස සියලු පුණ්‍යාධාර කොළඹ 05, හැව්ලොක් පාරේ අංක 191 හි පිහිටි රෝයල් ඉන්ස්ටිටියුට් ආයතනයේ ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය වෙනුවෙන් පිහිටුවා ඇති අංශයටද බාර දියහැක.
4. මෙම භාරය මගින් නිකුත් කැරෙන ධර්ම ග්‍රන්ථ මගින් ඔබගේ දායකත්වය වරින් වර දායක භවතුන්ගේ දැනගැන්ම සඳහා පළ කරනු ඇත.
5. ඔබ විසින් කරනු ලබන ආධාරය බැංකු ගිණුමට බැර කරන විට ඒ සඳහා නිකුත් කරනු ලබන කුවිතාන්සියෙහි ඡායා පිටපතක් පහත සඳහන් ලිපිනයට එවීමෙන් මෙම ධර්ම දානමය කටයුත්තට දායක වන ඔබගේ නම සහ දායක මුදල අප විසින් වරින් වර පළ කරන දායක ලැයිස්තුවෙහි ඇතුළත් කිරීම කළ හැකිය.

ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය
රෝයල් ඉන්ස්ටිටියුට්
අංක 191, හැව්ලොක් පාර
කොළඹ 05

# අමා ගඟ

මහවැලි ගඟ උතුරට හැරවීමෙන් පසු එතෙක් නිසරු මුඩු බිම් ලෙස පැවති පෙදෙස්වල සිදුවූයේ ඉමහත් වෙනසෙකි. පිපාසයට පැන්බිඳක් නොලබා සිටි ගොවීහු පෙදෙස පුරා නිහඬව ගලා යන සිසිල් දිය දහරින් පිනා ගියහ. මැලවුනු ගොයම සරුව නිල්වන්ව කරලින් බර විය. මල් පලින් ගැවසීගත් තුරු-ලිය බලා සැනසෙන පෙදෙස් වැසියෝ තුටු කඳුළු වගුළහ.

දහම් අමා ගඟ "උතුරට" හැරවීමේ වැඩ පිළිවෙළක් මෙයට තෙවසරකට පෙර ඇරඹුණි. දහම් පත-පොත තබා "එදා-වේල" සඳහා වත් විය පැහැදම් කිරීමට වත්-කමක් නැත්තෝ, නිහඬව නොමිලයේ ගලායන අමිල දහම් අමා දිය දහරින් සදහම් පිපාසය සන්සිඳුවා ගත්හ. අරිටු මිසදිටු හැර, සැදැහැයෙන් සරුව, ගුණ නුවණින් බරව පිළිවෙත් මහට නැමී ගත්හ. ලොවී - ලොවුතුරු මල් පල නෙලා ගනිමින් හද පුරා පිරි බැතියෙන් නන් අයුරින් සොම්නස පළකළහ.

"ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය" නමින් දියත් කළ මෙම ධර්මදාන වැඩපිළිවෙල සඳහා අපගෙන් වැයවුනේ පිරිසිදු ධර්මදාන සංකල්පය පමණි. අමාගඟ "උතුරට" හැරවූවෝ සසුන් ගුණ හඳුනන පරිත්‍යාගශීලී සැදැහැවත්හුමය. "නිවනේ නිවීම" පොත් පෙළ එළි දැක්වීමෙන් නොනැවතී "පහන් කණුව ධර්මදේශනා" පොත් පෙළෙහි "බර පැන" දැරීමටත්, දෙස් - විදෙස්වල දහම් පිපාසිතයින් උදෙසා අප අතින් ලියැවෙන අනිකුත් පොත - පත ඒ අයුරින්ම එළි දැක්වීමටත් ඔවුහු උත්සුක වූහ. "දෙන දේ පිරිසිදුවම දීමේ" අදහසින් අමිල වූ දහම ඊට නිසි ශෝභන මුද්‍රණයකින්ම ධර්මකාමීන් අතට පත් කිරීමට පියවර ගත්හ. මුද්‍රිත පිටපත් සංඛ්‍යාව අවසන්වනු හා සමගම "නැවත මුද්‍රණ" පළකිරීමෙන් දහම් අමා ගඟ වියළී යා නොදීමට දැඩි අදිටනකින් ඇප කැපවූහ.

"පොත් අලෙවිය" පිළිබඳව මෙකල බහුලව දක්නට ලැබෙන වාණිජ සංකල්පයට පිටුපා, තහංචිවලින් තොරව, තමන් අතට නොමිලයේම පත් කැරෙන "දහම් පඬුර" තුළින් ධර්මදාන සංකල්පයෙහි අගය වටහා ගත් බොහෝ පාඨක පින්වත්හු තමන් ලද රස අහරක්, නෑ-හිතවතුන් සමග බෙදා-හදා ගන්නාක් මෙන් නොමසුරුව අන් දහම් ලැදියනටද දී ධර්ම දානයට සහභාගී වූහ. ඉනුදු නොනැවතී, ශක්ති පමණින් "ධර්ම ග්‍රන්ථ මුද්‍රණභාරයට" උරදීමටද ඉදිරිපත්වූහ, ඇතැමෙක් ලොකු කුඩා දහම් පොත් මුද්‍රණය කරවීමේ හා නැවත-නැවත මුද්‍රණය කරවීමේ බරපැන ඉසිලීමට පවා පසුබට නොවූහ.



සම්බුදු සසුන මේ ලක් පොළොවෙහි පවතින තාක් මේ දහම් අමාගඟ ලෝ සතුන් සිත් සනහමින් නොසිඳී ගලා යේවා යනු අපගේ පැතුමයි.

**"සබ්බදානං ධම්මදානං ජිනාති"**

මෙයට,

සසුන් ලැදි

**කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු**

පොත්ගුල්ගල ආරණ්‍ය සේනාසනය
'පහන් කණුව'
කන්දේගෙදර, දේවාලේගම
2000 ජුනි 05 (2544 පොසොන්)

# චලන චිත්‍රය

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස**

***"ඒතං සන්තං***

***ඒතං පණීතං***

***යදිදං***

***සබ්බ සංඛාර සමථො***

***සබ්බූපධිපටිනිස්සග්ගො***

***තණ්හක්ඛයො***

***විරාගො***

***නිරොධො***

***නිබ්බානං"***

මෙය ශාන්තය,

මෙය ප්‍රණීතය,

එනම්

සියලු සංස්කාරයන්ගේ සංසිඳීම,

සියලු උපධීන් අතහැර දැමීම,

තණ්හාව ක්ෂය කිරීම,

නොඇල්ම නම් වූ විරාගය,

නැවැත්ම නම් වූ නිරෝධය,

නිවීම නම් වූ නිබ්බානය.

* * * * *



සංයුත්ත නිකායෙ ඛන්ධ සංයුත්තයෙ දෙවෙනි① ගද්දුල සූත්‍රය මහා ආශ්චර්යවත් සූත්‍රයක්. ඒකෙ බුදුපියාණන් වහන්සේ මෙන්න මේ විදියට ඉතාමත් වටිනා නිදර්ශන දෙකක් දෙනව:

**'*දිට්ඨං වො භික්ඛවෙ චරණං නාම චිත්තං*'**–

මහණෙනි නුඹලා චරණ නම් චිත්‍රයක් දුටුවාහුද? එහෙම නැත්නම් නුඹලා චරණ නම් චිත්‍රයක් දැකල තියෙනවාද?

**'*ඒවං භන්තෙ*'**–

'එසේය ස්වාමීනි'.

ඊළඟට බුදුපියාණන් වහන්සේ වදාරනව

**'*තම්පි ඛො භික්ඛවෙ චරණං නාම චිත්තං චිත්තෙනෙව චින්තිතං*'**–

මහණෙනි, ඒ චරණ නම් චිත්‍රයත් සිතින්ම සිතන ලද්දකි.

**'*තෙනපි ඛො භික්ඛවෙ චරණෙන චිත්තෙන චිත්තඤ්ඤෙව චිත්තතරං*'**–

මහණෙනි ඒ චරණ නම් චිත්‍රයටත් වඩා මේ සිතම විසිතුරුය.

**'*චිත්ත*'** කියන වචනය අර්ථ දෙකකින් යොදල තියෙනව. මෙතන බුදුපියාණන් වහන්සේ යොදන්නේ **'විචිත්‍ර'** කියන අර්ථයෙන්, **'*චිත්තතරං*'** කියන්නේ වඩා විසිතුරුය කියල අපට කියන්න පුළුවන්. චරණ නම් චිත්‍රය කියන්නේ ඒ කාලේ තිබුණු යම්කිසි චිත්‍රයක්.

① සංයුත්ත නිකායෙ ඛන්ධ සංයුත්තයෙ දෙවෙනි ගද්දුල සූත්‍රයෙ බුදුපියාණන් වහන්සේ මෙන්න මේ විදියට ප්‍රකාශ කරනවා.

***'දිට්ඨං වො භික්ඛවෙ චරණං නාම චිත්තන්ති. ඒවං භන්තෙ. තම්පි ඛො භික්ඛවෙ චරණං නාම චිත්තං චිත්තෙනෙව චින්තිතං තෙන පි ඛො භික්ඛවෙ චරණෙන චිත්තෙන චිත්තඤ්ඤෙව චිත්තතරං, තස්මාතිහ භික්ඛවෙ අභික්ඛණං සකං චිත්තං පච්චවෙක්ඛිතබ්බං, දීඝරත්තං ඉදං චිත්තං සංකිලිට්ඨං රාගෙන දොසෙන මොහෙනාති. චිත්තසංකිලෙසා භික්ඛවෙ සත්තා සංකිලිස්සන්ති චිත්තවොදානා සත්තා විසුජ්ඣන්ති. නාහං භික්ඛවෙ අඤ්ඤං ඒක නිකායම්පි සමනුපස්සාමි ඒවං චිත්තං යථයිදං භික්ඛවෙ තිරච්ඡානගතා පාණා. තෙ පි ඛො භික්ඛවෙ තිරච්ඡානගතා පාණා චිත්තෙනෙව චින්තිතා. තෙහිපි ඛො භික්ඛවෙ තිරච්ඡානගතෙහි පාණෙහි චිත්තඤ්ඤෙව චිත්තතරං"***

① 'නිවනේ නිවීම' 2 වෙනි වෙළුම 5 වන දේශනය. පිටුව 93

①දැන් මේ කාලේ තිබෙන චලන චිත්‍ර වගේ නොවෙන්න පුළුවනි. නමුත් යම්කිසි විශේෂ විදියෙ චිත්‍ර වර්ගයක් කියල අපට හිතාගන්න පුළුවන්. අටුවාවෙ තෝරන හැටියට තැනින් තැන ගෙනයාමෙන්, එහෙම නැත්නම් කරකැවීමෙන්, ස්ථාන මාරු කිරීමෙන් යම්කිසි විශේෂ විඥානයක් ලබාදෙන ශක්තියක් ඇති විශේෂ චිත්‍රයක් වෙන්න ඕන. ඒ චරණ නම් චිත්‍රය කොයි ආකාරයෙන් නමුත් විශේෂ විසිතුරු චිත්‍රයක් වෙන්න ඕන.

ඒ විසිතුරු චිත්‍රයටත් වඩා සිත විචිත්‍රයි කියල බුදුපියාණන් වහන්සේ වදාරනව. ඒකට හේතුව කියන්නේ '***තම්පි ඛො භික්ඛවෙ චරණං නාම චිත්තං චිත්තෙනෙව චින්තිතං***'. මක්නිසාද ඒ චරණ නම් චිත්‍රයත් සිතින්ම සිතන ලද්දක් නිසා.

ඊළඟට බුදුපියාණන් වහන්සේ ඒ අනුවම භික්ෂූන් වහන්සේලාට අවවාදයක් හැටියට ප්‍රකාශ කරනව: '***තස්මාතිහ භික්ඛවෙ අභික්ඛණං සකං චිත්තං පච්චවෙක්ඛිතබ්බං***'- එමනිසා මහණෙනි ක්ෂණයක් පාසා, මෙහොතක් පාසා, තමාගේම සිත පිළිබඳව ප්‍රත්‍යවේක්ෂා කර බැලිය යුතුයි. ආපසු හැරී බැලිය යුතුයි ' ***දීඝරත්තං ඉදං චිත්තං සංකිලිට්ඨං රාගෙන දොසෙන මොහෙනාති***'- 'දීර්ඝ කාලයක් මේ සිත රාගයෙන්, ද්වේශයෙන්, මෝහයෙන්, කිලිටි වෙලයි තියෙන්නෙ. '***චිත්ත සංකිලෙසා භික්ඛවෙ සත්තා සංකිලිස්සන්ති චිත්තවොදානා විසුජ්ඣන්ති***'- සිත කිලිටිවීමෙන් සත්ත්වයෝ කිලිටි වෙත්. සිත පිරිසිදු වීමෙන් සත්ත්වයෝ පිරිසිදු වෙත්. * * * *

කෙනෙකුට හිතෙන්නෙ මේ චිත්‍රය ඇන්ද තැනැත්තා ගැනය, බුදුපියාණන්වහන්සේ කතා කරන්නෙ කියල. නමුත් මෙතන ගැඹුරු අර්ථයක් තියෙන්නෙ. මේ චරණ නම් චිත්‍රය සිතින්ම සිතන ලද්දේය, කියල ප්‍රකාශ කරන්නෙ චරණ චිත්‍රය ඇන්ද කෙනා මේක හිතින් හිතල ඇන්ද නිසා නොවෙයි. මේ චිත්‍රය දකින කෙනා, මේ චිත්‍රය

① 'නිවනේ නිවීම' 2 වෙනි වෙළුම 5 වන දේශනය. පිටුව 94



විචිත්‍ර හැටියට සලකනව. එහෙම නැත්නම්, **මේ චිත්‍රය බලන පුද්ගලයා මේ චිත්‍රය සිතින් මවා ගන්නව.** ඇත්තවශයෙන්ම මේ චිත්‍රය ඇන්ද තැනැත්තා ගැන නොවෙයි මෙතන කියන්නෙ. අර නරඹන්නාගේ සිතේ තිබෙන, දීර්ඝ කාලයක සිට පවතින රාග, ද්වේෂ, මෝහ, කියන ඒ ක්ලේශ ධර්මවලට පිං සිද්ධවෙන්න තමයි අර චිත්‍රය ආස්වාද කරන්න පුළුවන් වෙන්නෙ. ඒකෙ රස විඳින්න පුළුවන් වෙන්නෙ. * * * *

① ඊළඟට අපට 'චරණචිත්‍ර' ගැන නොවෙයි 'චලනචිත්‍ර' ගැනයි කථා කරන්න වෙන්නෙ. ඒ කියන්නේ සිනමා ලෝකය - චිත්‍රපටි. චිත්‍රපටි, නාට්‍ය සංදර්ශන ආදිය මුල්කරගෙන අපි ටිකක් සිත යොමු කරල බැලුවොත් **මෙතන පවතින ධර්මතාව**, ලෝකයේ එළිපිට - චිත්‍රපට ශාලා වලින් නෘත්‍ය ශාලාවලින් පිටත - තිබෙන **ජීවිතයේම කොටසක්.** නමුත් පිටත තිබෙන ජීවිතය වටහාගැනීම සාමාන්‍යයෙන් අපහසු නිසා, වඩා පහසු චිත්‍රපටිය පිළිබඳ කාරණය ගැන ඊළඟට අපි ටිකක් විවරණය කරන්න බලමු.

සාමාන්‍යයෙන් චිත්‍රපටියක්, නාට්‍යයක් එහෙම පැවැත්වෙන්නෙ රාත්‍රි කාලයෙයි. ඒකට හේතුව අන්ධකාරය තිබෙනව. මේ අඳුර අර සත්ත්වයාගේ සිත් තුළ තිබෙන අවිද්‍යාන්ධකාරය මතුකරල දෙනව. එතකොට චිත්‍රපටියක් නාට්‍යයක් ආදිය අඳුරු රාමුවක් තුළයි ප්‍රදර්ශනය කෙරෙන්නෙ. අවිද්‍යා අංගය අපට එතනම ඉදිරිපත් වෙලා තියෙනව. යම්කිසි විදියකින් දවල් කාලයෙ චිත්‍රපටි ආදියක් පෙන්වනව නම්, සිනමාශාලාවල ජනෙල් ආදිය වහල, කළුතිර දාල, ආවරණය කරගෙනයි ඒක කරන්නෙ. ඔය විදියෙ මහ ආවරණයක් මැදයි මේ චිත්‍රපට, නාට්‍ය ආදිය පෙන්වන්නෙ.

ඒ වගේ තවත් මහා පුදුම දෙයක් සිද්ධ වෙනව. නොයෙකුත් පුද්ගලයින් 'මම චිත්‍රපටි බලන්න යනව' 'නාට්‍ය බලන්න යනව'

① 'නිවනේ නිවීම' 2 වෙනි වෙළුම 5 වන දේශනය. පිටුව 96

කියල යනව. 'මම චිත්‍රපටි බැලුව' 'නාට්‍ය බැලුව' කියල එනව. නමුත් ඒ චිත්‍රපටි ශාලාවල, නෘත්‍යශාලාවල, **චිත්‍රපටිය පෙන්වන අවස්ථාවෙ, නෘත්‍ය පැවැත්වෙන අවස්ථාවෙ, මේ චිත්‍රපටියක්ද බලන්නෙ, නාට්‍යයක්ද බලන්නෙ කියන එක අමතක වෙනව.** ඔන්න ඔය විදියෙ මහ පුදුම මෝහනයක්. මෙතනත් අර ආශ්‍රවයන්ගේ මත්වීම් ශක්තියක් තියෙන නිසා, යම්කිසි චිත්‍රපටයක, නාට්‍යයක ආස්වාදයක් විඳින්න ඕන නම්, ඒකට ලෑස්තිවෙලා ඉන්න ඕන මත්වෙන්න. මත් වෙන්න බැරිනම් ඒක ඒ තැනැත්තාට නාට්‍යයක් නොවෙයි. චිත්‍රපටියක් නොවෙයි. චිත්‍රපට නාට්‍ය නිෂ්පාදකයින් කරන්නෙ මොකක්ද?

බලන්න එන ඒ නරඹන්නාගේ සිත් තුළ තිබෙන අවිද්‍යා ආශ්‍රව මතුකරල ගන්න පුළුවන් විදියට පසුබිම් සකස් කිරීමයි. ඒ නිසා තමයි රාත්‍රි කාලයේ පවත්වන්නෙ. එහෙම නැත්නම් කළුතිර ආදිය යොදන්නෙ.

මේ නිෂ්පාදකයින්ට තවත් වැඩ රාශියක් තියෙනව. අර ඇතිකරගත්තු අඳුරු රාමුව තුළ එන නරඹන්නන්ගේ සිත්තුළ මෝහනයක් ඇති කරල යම්කිසි කථාවස්තුවක් හරියට 'තාත්ත්වික' අන්දමින් පෙන්වන්න ඕන. 'තාත්ත්වික' කියන එක කලා ලෝකයේ තියෙන වචනයක් - දැන්, 'තත්ත්ව' කියල කියන්නෙ 'සත්‍යය' කියන එකයි. නමුත් "තාත්ත්වික" කියන්නෙ 'සත්‍යය' නොවෙයි. 'සැබෑ සවරූපයක් ඇති, 'ඇත්ත වාගේ පේන' කියන එකයි. - එතකොට චිත්‍රපටයක්, නාට්‍යයක් සාර්ථක වීමට නම් ඒක තාත්ත්වික වෙන්න ඕන. තාත්ත්වික කියන්නෙ බලන කෙනාට මේක සැබෑ දෙයක් හැටියට පෙනෙන විදියට තියෙන්න ඕන. එක්තරා විදියක රැවටිල්ලක් මෙතන තියෙන්නෙ - මායාවක්.

① තාත්ත්වික විදියට ඉදිරිපත් කිරීමට නළුනිළියන්ගේ අඟපසඟ සැරසිලි ආදිය අවශ්‍යයි - ඇත්ත වශයෙන්ම ඒ ඈත අතීතයේ

① 'නිවනේ නිවීම' 2 වෙනි වෙළුම 5 වන දේශනය. පිටුව 97



භාරතීය සමාජයේ 'සංස්කාර' කියන වචනයේ මූලික අර්ථයක් තමයි ඒ නළුනිළියන් කළ අංගසංස්කාරාදිය. මේ අඟපසඟ සැරසිලි ආදිය තමයි සංස්කාර.

එපමණක් නොවෙයි. පසුබිම් සැරසිලි, අනිකුත් රඟපෑම් ආදිය පවා මේ හැම එකක්ම සංස්කාර හැටියට සලකන්න පුළුවන්. චරිත නිරූපන පසුබිම් සැරසිලි ආදිය. මෙන්න මේව තමයි සංස්කාර.

එතකොට අර අන්ධකාරයෙන් නරඹන්නන්ගේ සිතේ ඇති අවිද්‍යා ආශ්‍රව මතුකර ගන්න එක්තරා **සුදුසු පරිසරයක් ඇතිකළා චිත්‍රපට නිෂ්පාදකයින්**, නාට්‍ය නිෂ්පාදකයින්. ඒ වගේම අඟපසඟ සැරසිලි ආදියෙනුත් අර සංස්කාර ඇතිකළා.

ඇත්තවශයෙන්ම මේ සංස්කරණය කරන්නෙ නම් ඒ නරඹන්නයි. දැන් මෙතන මහපුදුම කියමනක් කියන්න සිද්ධ වෙනව. කලිනුත් අපට ඒ විදියෙ දේවල් කියන්න සිද්ධ උනා. ඒ කියන්නෙ **මෙතෙක් කිසිම සිනමාශාලාවක, සිනමා තිරයක චිත්‍රපටයක් පෙන්නල නැහැ. මෙතෙක් කිසිම නාට්‍ය ශාලාවක, නෘත්‍ය වේදිකාවක නාට්‍යයක් පෙන්නල නැහැ.** නමුත් ඒ චිත්‍රපට ශාලාවලට, නාට්‍යශාලාවලට ගිය අය චිත්‍රපට නාට්‍ය දුටුව. මේ කොහොමද සිද්ධ උනේ?

සාමාන්‍යයෙන් අපි හිතන්නෙ මේ චිත්‍රපට නාට්‍ය නිෂ්පාදකයින්ය චිත්‍රපට නාට්‍ය හැදුවෙ කියල. නමුත් අවසාන වශයෙන් බුදුපියාණන් වහන්සේ චරණ චිත්‍රය ගැන වදාළ ඒ කාරණය අනුව අපි ගැඹුරින් කල්පනා කරල බලනව නම්, **චිත්‍රපටයක් නාට්‍යයක් - ඒ අවසාන පරිච්ඡේදයෙන් බලනකොට - නිෂ්පාදනය කරන්නෙ නරඹන්නමයි.**

ඒ නරඹන්න, ඒව නරඹන්න යනකොට ඒ චිත්‍රපට ආදියට දාන්න ඕන ලුනු ඇඹුල් ආදියත් අරගෙනයි යන්නේ. ඒ කියන්නෙ ආශ්‍රව. ඒ ආශ්‍රවයන්ගෙන් චිත්‍රපටයේ යම්කිසි අඩුපාඩුවක් තිබුණත් වැහිල යනව. අපි දන්නව නාට්‍යාදියෙ එක ජවනිකාවක ඉඳල අනිත් ජවනිකාවට එන්න එක්තරා කාලසීමාවක් තියෙනව. නමුත්

මෙබඳු නාට්‍යයක් පවා සාමාන්‍ය ජනයාට රසවිඳින්න පුළුවන් වන්නෙ කාමාසව, භවාසව, අවිජ්ජාසව කියන ඒව නිසයි.

විද්‍යාත්මක වශයෙන් දියුණු වෙන්න දියුණු වෙන්න, මේ ජවනිකා ඉතාමත්ම ශීඝ්‍රකරල තමයි චිත්‍රපට තිරයක වැටෙන්න සලස්වන්නෙ. මෙතනත් කෙරෙන්නෙ මෝහනයයි. නරඹන්නන් තුළ මෝහනය ඇති කිරීමට සුදුසු පරිසරයක් ඇති කිරීමයි. ඒ වගේම කොයි විදියට සැරසිල සිටියත්, සංස්කරණ කොයිවිදියට තිබුණත්, නරඹන්නන්ගේ සිතේ සංස්කරණ ඒකට හරියන්නෙ නැත්නම් නාට්‍යය සාර්ථක වෙන්නෙ නැහැ. එයට රැවටෙන්නෙ නැහැ.

නමුත් ලෝක සත්ත්වයාගේ සිත්තුළ තියෙනව සංස්කරණය කිරීමේ ගතියක්. ඒක නිසා මදිපාඩුවට තමනුත් යමක් දමල ඒ චිත්‍රපටය, නාට්‍යය සම්පූර්ණ කරගෙන විනෝදවෙනව. ආස්වාදය ලබනව. ඔය විදියෙ තත්ත්වයක් තියෙන්නෙ.

① දැන් අපි ටිකක් කල්පනා කරල බලමු. අවිද්‍යා රාමුව තුළයි මේ චිත්‍රපට නාට්‍ය ආදිය පැවැත්වෙන්නෙ. දවල් කාලයේ පැවැත්වෙන චිත්‍රපටියක් ගැන කල්පනා කරනවනම් අර විදියට දොරවල් එහෙම වහගෙනයි චිත්‍රපටියක් පෙන්වන්නෙ. මේ විදියට හොඳ විචිත්‍ර වෛවර්ණ චිත්‍රයක් තිරේ වැටෙන අවස්ථාවක හදිසියේම දොරවල් ඇරුන කියල හිතමු. එතකොට මොකක්ද වෙන්නෙ?

ඒ නරඹන්නන් මවාගෙන හිටිය ලෝකයෙන්, ඔවුන්ගේ සිනමා ලෝකයෙන්, ඔවුන් එළියට විසිවුනා වගෙයි, හදිසියෙන්ම. මක්නිසාද?

**තිරයෙ වැටෙන වෛවර්ණ චිත්‍රයෙ පාට ගියා.** පාට මැකිල ගියා. ඒකෙ ප්‍රතිඵලයක් වශයෙන් ඊළඟට කලකිරීමයි එන්නෙ. මේකත් චිත්‍රපටියක්ද කියල හිතෙනව. මේක මොකක්ද කියල හිතෙනව.

① 'නිවනේ නිවීම' 2 වෙනි වෙළුම 5 වන දේශනය. පිටුව 97



**චිත්‍රපටිය චිත්‍රපටියක් උනෙ, නාට්‍යය නාට්‍යයක් උනේ අවිද්‍යා අඳුරු රාමුවෙත් සංස්කාරවලත් බලයෙන්.** නමුත් මේ අඳුරු රාමුව නැතිවීමෙන් අර විදියෙ විශාල වෙනසක් සිදු උනා. ඒ එක්කම නරඹන්නන්ට කලකිරීමක් ඇතිඋනා. මක්නිසාද - රාග කියන වචනයෙ පාට කියන අර්ථයක් තියෙනව. මෙතන 'විරාග' කියන එකේ වාච්‍යාර්ථයකුත් තියෙනව 'පාට සේදීයාම' සායම මැකීයාම කියල. එතකොට '*නිබ්බිදා* - විරාගය' එක්තරා විදියක පටු අර්ථයකින් '*නිබ්බිදා* - විරාගයක්' වගේ දෙයක් ඇතිවෙනව, අර විදියට හදිසියෙන්වත් දොරක් ඇරුනොත්. ඒ තිබුන මෝහනය එතැනින් තාවකාලිකව හරි නැතිවෙනව.

නමුත් අපි ටිකකට හිතමු. මේ පිටතින් එන ආලෝක ධාරාවකිනුයි මේ චිත්‍රපටය, චිත්‍රපටයක් නොවන තත්ත්වය ඇති වුනේ. **මේ ආලෝකධාරාව සිතින්, සිත ඇතුළතින් ආවොත් එහෙම මොකද වෙන්නෙ?**

ඒත් ඒ හා සමාන දෙයක් සිද්ධ වෙන්නෙ. සිත ඇතුළතින්ම යම්කිසි කෙනෙකුට ප්‍රඥා ආලෝකය පහළ උනොත්, චිත්‍රපටයක් නාට්‍යයක් බලන අවස්ථාවක, අනිත් අය නාට්‍යය බල බලා ඉඳීවි. නමුත් ඒ තැනැත්තාට මේකත් චිත්‍රපටයක්ද, මේකත් නාට්‍යයක්ද කියල හිතෙනව.

අපි ඒ චිත්‍රපටය ගැන කියන කොට කිව්ව ඒ අවස්ථාවෙ නරඹන්න ඉන්නෙ එක්තරා ලෝකයකට ඇතුළු වෙලයි කියල. ඒකට අපට කියන්න පුළුවන් තවදුරටත් පටිච්චසමුප්පාද ධර්මය අනුවම විග්‍රහ කරනවනම්, නරඹන්නන් ඇත්තවශයෙන්ම **අවිද්‍යාඅන්ධකාරය මැද සංස්කාර මුල්කරගෙන ඒ චිත්‍රපටි කථාවට සුදුසු අන්දමේ විඤ්ඤාණයකුත් ඊට නිසි නාමරූපයකුත් ඇතිව** ඒ සම්පූර්ණ විඳින සමූහයෙන් පඤ්චස්කන්ධයක් සකස් කරගත්ත කියල. අන්න ඒ විදියෙ වැඩක් මෙතන තියෙන්නෙ.

එතකොට ප්‍රඥා ආලෝකය ඇවිල්ල, අවිද්‍යා අන්ධකාරය නැති උනත් ඒ විදියෙම දෙයක් සිද්ධ වෙන්නෙ. ඒ භවයෙන් ඉවතට එනව. ඒ කාමලෝකයෙන්, ඒ භවයෙන් තාවකාලිකව හරි එළියට එනව.

① දැන් එතකොට රහතන්වහන්සේල පිළිබඳවත් මේ විදියෙ දෙයක් සිද්ධ වෙන්නෙ. රහතන් වහන්සේලාගේ අර තිබුණු 'අවිද්‍යාව' - '*අවිජ්ජායත්වෙව අසෙස විරාගනිරොධා*'-ආශ්‍රව ටිකක් හරි ඉතුරු කරල නොවෙයි, සම්පූර්ණයෙන්ම ඒ අවිද්‍යාව නිරුද්ධ වෙනකොට ඒ එක්කම සංස්කාරත් නිරුද්ධයි. මක්නිසාද?

සංස්කාරයන් සංස්කාරයන් බවට පත් උනේ අවිද්‍යාවෙ පිහිටෙන්. අවිද්‍යාව ඇතිතාක් තමයි ඒව සංස්කාර වෙන්නෙ. සංස්කාර කියල කියන්නෙ සාමාන්‍යයෙන් සකස් කිරීම්, මවාපෑම් කියන එකයි. එතකොට මේ සකස් කිරීම්, අර ඇඳීම් සියල්ලෙන් යම්කිසි මෝහනයක් ඇතිකිරීමයි කළේ. ඒකට තිසි පරිසරයයි අවිද්‍යා අන්ධකාරයෙන් සැපයුනේ.

යම්කිසි විදියකින් ප්‍රඥා ආලෝකය ආවොත් අර සංස්කාර විසංස්කාර වෙනව. සංඛතය අසංඛතය වෙනව. එතකොට ඔය චිත්‍රපටය පිළිබඳව දක්වූ ධර්මතාවම ඊට වඩා ගැඹුරු අර්ථයකින් ගන්න පුළුවන් මේ රහතන්වහන්සේලා පිළිබඳව වන පරිවර්තනයේදී. ඒ ප්‍රඥා ආලෝකය පහළවීමත් සමහම සංස්කාර විසංස්කාර වෙනව. බාහිර ලෝකයාට ඒව සංස්කාර හැටියට පෙනුනට, රහතන් වහන්සේට ඒවා සංස්කාර නොවෙයි. මක්නිසාද? භවයක් මැවෙන්නෙ නැහැ. භවයක් මවන්න බැහැ. ඒ වගේම අර සංඛතය සකස් කරන ලද්දක්ව තිබෙන එක සකස්කරන ලද බව තේරුම් ගත්තාම, ඒක නොසකස් වෙනව. අසංඛතයක් වෙනව. සියුම් ධර්මතාවක් එතන තියෙන්නෙ.

① 'නිවනේ නිවීම' 2 වෙනි වෙළුම 5 වන දේශනය. පිටුව 98



තවත් ඒ විදියෙම ගාථාවක් උදාන පාළියේදී හමුවෙනව.

"*මොහසම්බන්ධනො ලොකො - භබ්බරූපොව දිස්සති*
*උපධි සම්බන්ධනො බාලො - තමසා පරිවාරිතො*
*සස්සතො විය ඛායති - පස්සතො නත්ථි කිඤ්චනං*"

'***මොහ සම්බන්ධනො ලොකො භබ්බරූපොව දිස්සති***'-

මේ මෝහයට සම්බන්ධ වූ තැනැත්තාට ලෝකය බොහොම භව්‍යදෙයක්.

'ඇත්ත වෙන්න පුළුවන්' කියන අදහසයි භව්‍ය කියන වචනයේ තියෙන්නෙ. මේ ලෝකය භව්‍ය දෙයක් හැටියට, සත්‍ය දෙයක් - හොඳට විශ්වාසය තියන්න පුළුවන් විදියෙ දෙයක් - කියල ඒ විදියටයි මෝහයට බැඳුනු පුද්ගලයට පේන්නෙ.

① '***මොහ සම්බන්ධනො ලොකො භබ්බරූපොව දිස්සති***'

මෝහයට සම්බන්ධ වූ තැනැත්තාට ලෝකය බොහොම භව්‍ය දෙයක් හැටියට පේනවා.

'***උපධි සම්බන්ධනො බාලො*** '

මේ උපධීන්ට බැඳුනාවූ බාලයා - මෝඩයා - අඥාන පුද්ගලයා'

***තමසා පරිවාරිතො***

② මහා අන්ධකාරයකින්, කළුවරකින් පිරිවරන ලදුවයි සිටින්නෙ. වැහිලයි සිටින්නෙ.

'***සස්සතො විය ඛායති***'- හරියට බැලූබැල්මට මේක සදාකාලික වගේ - ශාස්වත වගේ පෙනෙනව.

① 'නිවනේ නිවීම' 2 වෙනි වෙළුම 5 වන දේශනය. පිටුව 99
② 'නිවනේ නිවීම' 2 වෙනි වෙළුම 5 වන දේශනය. පිටුව 100

'*පස්සතො නත්ථි කිඤ්චනං*'- දකින්නෙකුට මෙතන ඇති 'දෙයක් නෑ' කියල කියන්ට වෙනව. මේ විදියට ඉතාමත්ම ගැඹුරු අර්ථයක් ප්‍රකාශ කරනව මේ ගාථාව.

මෙයින් අපට පේනව චිත්‍රපටයක් පිළිබඳවත්, නාට්‍ය පිළිබඳවත් **අඩු වැඩි වශයෙන් ශීඝ්‍රව ධාවනය කෙරෙන ජවනිකා රාශියකින්, යම්කිසි කථාන්තරයක් මවාගෙන විනෝද වෙනවා.**

ඒ සත්ත්වයින්ට, පුද්ගලයින්ට, නළුනිළියන්ට තාවකාලිකව දාගත්තු ඇඳුම් ආදිය නිසා මෝහනයක් ඇති කරගෙන මේ අහවලාය, මේ අහවලාය; ඒ සමහම තමනුත් ඒ මොහොතේ ජීවත් වෙනවා.

ධර්මානුකූලව කල්පනාකර බලනකොට. නෘත්‍යශාලාවලින්, චිත්‍රපටිශාලාවලින්, පිටත ජීවිතයත් ඒ විදියෙ එකක්.

නමුත් පිටත තියෙන අන්ධකාරයට වඩා ඇතුළත තියෙන අන්ධකාරය ඉතාමත්ම ඝන බහල එකක්. පිටත තියෙන අන්ධකාරය නම් අර විදියට දොරක් ඇරුන හැටියෙම නැතිවෙලා යන්න පුළුවනි. නමුත් ඇතුළත තියෙන අන්ධකාරය එහෙම ලෙහෙසියෙන්ම කැඩෙන්නෙ නැහැ. ඒකනිසා තමයි අර ථෙර ථෙරී ගාථා ආදියෙ තියෙන්නෙ '*තමොක්ඛන්ධං පදාලෙත්වා, තමොක්ඛන්ධං පදාලිය*' මේ අඳුරුකඳ පැලුව කියල. ඒ තරම් පලන්න පුළුවන් - කැලිකපන්න පුළුවන් - විදියෙ අවිද්‍යා අඳුරක් තමයි ලෝකයෙ තියෙන්නෙ. මේ ඇතුළත තියෙන අන්ධකාරය ඉතාමත්ම ඝන බහල එකක්.

ඇතුළත තියෙන අන්ධකාරයෙ පළමු විවරය ඇතිවෙන්නෙ සෝවාන්මාර්ගඥානයෙන්. අන්න ඒක නිසා අපට හිතාගන්න පුළුවනි, අර ධර්මකථාවක් තියෙනව සැරියුත් මුගලන් මහරහතන්වහන්සේලා පිළිබඳව. මේ සැරියුත් මුගලන් ස්වාමීන්වහන්සේලා දෙනම පරිබ්‍රාජක කාලයේදී - ඒ කාලයේදී නම් තිබුනේ උපතිස්ස, කෝලිත, කියල - උපතිස්ස කෝලිත කියන මේ බ්‍රාහ්මණ තරුණයො දෙන්න එක දවසක්දා ගියා '*ගිරග්ග සමජ්ජ*' කියන කඳුමුදුනක පැවැත්වෙන එක්තරා සමාජ උත්සවයක් බලන්න. අපට හිතාගන්න පුළුවන් නොයෙකුත්



නාට්‍යාදිය පෙන්වන විවිධප්‍රසංගයක් වෙන්න ඇති. ඒ අවස්ථාව නුවණ හොඳට මෝරල තිබුණ අවස්ථාවක් නිසා මේ දෙන්නටම හිටිගමන්ම අර *ගිරග්ගසමජ්ජයෙ*, '*ගිරග්ගසමජ්ජ* - බව' නැතිවෙල ගියා. කලකිරීමක් ඇති උනා. වෙනද වගේ හිනාවක් සන්තෝෂයක් නැහැ.

මේ ඇතුළත තියෙන දේම නේද පිටත තියෙන්නෙ කියල වැටහෙන්න ඇති.

නමුත් මේ කියන මෝහය සම්පූර්ණයෙන්ම වැටහුනේ නැහැ - ඒ ධර්මතාව. ඊළඟට අස්සජි ස්වාමීන්වහන්සේ උපතිස්ස පරිබ්‍රාජකයට හදිසියෙ හමුවුනාම උන්වහන්සේට ආරාධනා කළා 'මට ටිකක් කිව්වාම ඇති: මට තේරුම් ගන්න පුළුවන්' කියල. අස්සජි ස්වාමීන්වහන්සේත් බොහොම නිහතමානීව 'මමත් බොහොම ① ටිකයි දන්නෙ' කියල ඒ ටික කිව්වා.

*යෙ ධම්මා හෙතුප්පභවා - තෙසං හෙතුං තථාගතො ආහ*
*තෙසඤ්ච යො නිරොධො - එවං වාදී මහා සමණො*

හේතුන්ගෙන් හට ගන්න යම් ධර්මයන් තිබෙනව නම්, ඒවායේ හේතුවයි, 'ඉදප්පච්චයතාව-'.

මෙය ඇති කල්හි - මෙය වෙයි.
මෙය හටගැනීමෙන් - මෙය හටගනී,
මෙය නැති කල්හි - මෙය නොවෙයි.
මෙය නිරුද්ධ වීමෙන් - මෙය නිරුද්ධ වෙයි.'

- කියන අන්න ඒ අදහසයි. ඊළඟට හේතුසමුප්පන්න ධර්මයන්ගේ ක්ෂයකිරීම තමයි අවසානයේ නිවන. ටිකයි කිව්වේ. උපතිස්ස මාණවකයත් ටිකයි අහගත්තෙ. නමුත් එතන හැම දෙයක්ම තිබුන නිසා තමයි සෝවාන් උනේ. * * * *

② චිත්‍රපටයක නාට්‍යයක ඇති ඒ සංස්කාරයන්, සංස්කාර වන්නෙ අවිද්‍යාව ඇතිතාක්, ඒ අඳුර ඇතිතාක්. නළු නිළියන්ගේ වෙස්වලාගැනීම, ඇඳුම්, පැළඳුම්, ඇඬුම්-දෙඬුම්, ඒ හැම එකකම

① 'නිවනේ නිවීම' 2 වෙනි වෙළුම 5 වන දේශනය. පිටුව 101
② 'නිවනේ නිවීම' 2 වෙනි වෙළුම 6 වන දේශනය. පිටුව 112

සත්‍යතාව-සැබෑ ස්වරූපය- පවතින්නෙ ඒවා මුවහකරන අවිද්‍යාව නිසයි. අන්න ඒ නිසා මේ සංස්කාරවලට සත්‍යතාවක්, සැබෑ ස්වරූපයක් ගන්නවන්නේ අර අවිද්‍යාව බවයි මෙතනින් පේන්නේ.

යම්කිසි අවස්ථාවක ඒ අවිද්‍යාව නැති උනොත් ඒ කොයි අන්දමේ සැරසිලි වෙස්වලා ගැනීම් තිබුණත් නරඹන්නන්ට සැප දුක් ඇතිවන්නේ නැහැ. ආස්වාදයක් ඇතිවෙන්නේ නෑ. මේ ආස්වාදයක් ඇති නොවන අවස්ථාව තමයි අපි කලින් දේශනාවක සඳහන් කළේ. අර කෝලිත උපතිස්ස දෙදෙනාට *ගිරග්ග සමජ්ජය* දකින අවස්ථාවෙ, **අන්න අර ප්‍රඥා ආලෝකය-පිටතින් එන ආලෝකයක් නොවෙයි ඇතුළතින් එන ආලෝකය**-මතුවුන නිසා අර විදියට එක්තරා වැටහීමක් ආව. ඒක නිසා සංස්කාරයන්ගේ සංස්කාර ස්වභාවය නැතිවෙලා ගියා. එතකොට මෙයින් අපට පේනව සංස්කාර කියන වචනය ඇත්ත වශයෙන්ම අර්ථවත් වෙන්නෙ අවිද්‍යා පසුබිමේ. * * * *

① සාමාන්‍ය ලෝකයා චිත්‍රපටියක් දක්කයි කියල කිව්වට මොකද **ඇත්ත වශයෙන් පෙනෙන්නෙ අර සිනමා තිරයෙ ඒ බලන අවස්ථාවෙ එක්තරා දර්ශනයක් පමණයි.** අපි කලින් කිව්ව හැටියට 'අපි චිත්‍රපට බලන්න නාට්‍ය බලන්න යනව' කියල යනව, 'අපි බැලුව කියල එනව.' නමුත් ඇත්ත වශයෙන්ම ඔවුන් චිත්‍රපටියක් දුටුවෙ නැහැ. සම්පූර්ණ නාට්‍යයක් දුටුවේ නැහැ. මොකක්ද සිද්ධ උනේ? කොහොමද චිත්‍රපටියක් දකින්න ලැබුනේ?

**සංස්කාර සන්තතියෙන් විඤ්ඤාණ තිරයෙ නාමරූපයක් මවාගන්නව** වගේ, සිනමා තිරයෙ වැටෙන ජවනිකා සමූහය එකතුකරගෙන ඒකෙන් කථාන්තරයක් හදා ගන්නව, ගොඩනගා ගන්නව, අර නරඹන්නා. ඒ කියන්නෙ, දැන් සමහරවිට චිත්‍රපට ශාලාවක, කවුරුවත් නරඹන්නෙ නැති අවස්ථාවක චිත්‍රපටි සේයාරූ පටයක් තිරයෙ වැටෙන්න සැලැස්වුවොත් මේක චිත්‍රපටියක් වෙනවද?

① 'නිවනේ නිවීම' 2 වෙනි වෙළුම 6 වන දේශනය. පිටුව 118



ඒ විදියට ඒ චිත්‍රපටිය පෙන්වන්න පටන් අරගෙන, ඒක මැදහරියෙදි, කෙනෙක් ආවොත් ඒ ශාලාවට, අර චිත්‍රපටියෙ තමන්ට දක්නට නොලැබුණ හරිය කෙසේවත් සළකාගන්න බැහැ. ඒක ගියා ගියාමයි. ඒ සංස්කාර ගියා ගියාමයි.

එතකොට මේක චිත්‍රපටියක් වෙන්නෙ මේක අර නරඹන්නන් පාවිච්චි කරන එක්තරා ලාටුවක් නිසා - තණ්හාව නිසා. මේ තණ්හාව පිළිබඳව බුදුපියාණන් වහන්සේ දේශනා කරල තියෙනව ලක්ෂණ තුනක්. '*පොනොබ්භවිකා, නන්දිරාග සහගතා, තත්‍රතත්‍රාභිනන්දිනී*' කියල. එතකොට තණ්හාවෙ තියෙනව එක ලක්ෂණයක් පොනොබ්භවිකා. ඒ කියන්නෙ ඒක පුළුල් අර්ථයෙන් ගත්තොත් පුනර්භවයක් ඇති කරනව කියල කියනකොට කෙනෙක් කල්පනා කරනව සංසාරයේ එක භවයක් තව භවයක් හා ගැළපීම පමණයි කියල තණ්හාවෙන් කෙරෙන්නෙ. නෑ.

මේ හැම මොහොතක් පාසාම එකකට එකක් ගලපන්නෙ තණ්හාවෙනුයි. චිත්‍රපටයක් බලන කෙනෙක්, පළමු ජවනිකාව ඊළඟ ජවනිකාවත් එක්ක සම්බන්ධ කරලයි දෙවන එක තේරුම් ගන්නෙ. අන්න ඒ විදියට තමයි අර චිත්‍රපටිය බලල ඇවිල්ල කියන්නෙ, අපි චිත්‍රපටියක් දුටුව කියල. ඇත්ත වශයෙන් ඒ සමූහයම එකපාරටම ඒ තිරයෙ වැටෙනව නෙවෙයි. නමුත් එකකට එකක් ගලපගන්නව. අන්න '*පොනොබ්භවිකා*'. කලින් ජවනිකාව, ඊළඟ ජවනිකාවට සම්බන්ධ කරනව. පුනර්භව වශයෙන්, නැවත හටගන්වන කියන අදහස තියෙනව '*පුනබ්භව*.'

මේ චිත්‍රපටිය රස විඳින්න ඕනෑ කරන අනික් බෙහෙත *නන්දිරාගසහගතා*. මේ පිළිබඳව සතුටුවන ස්වභාවයක් සහ ඇලෙන බවක්. තණ්හාව විශේෂයෙන්ම ලාටුවක් වගේ - තණ්හාවට යෙදෙන පර්යාය පදයක් තමයි 'ලේප'. '*විසත්තිකා*' කියලත් යොදනව. යමක් අලවන කියන අර්ථය. ඇලෙන සුළු බව, මේ 'රාග' කියල කියන්නෙ, මේකෙත් තියෙනව අලවන අර්ථය. **එතකොට තණ්හාව මගින්, ආශාව මගින්, මේ ජවනිකා සමූහය අලවනව.**

ඊළඟට **'තත්‍රතත්‍රාභිනන්දිනී'** විශේෂයෙන් සතුටුවෙනව ඒ ඒ තැන. ඒ ඒ තැන සතුටුවෙනව කියන්නෙ අර එක් එක් ජවනිකාව එකකට එකක් සම්බන්ධකරනව. මෙයින් තමයි කථාන්තරයක් ගොඩනඟා ගන්නෙ. මෙන්න මේ නිසා තමයි අපි කිව්වෙ. **'එකම සිනමා ශාලාවකවත් මෙතෙක් චිත්‍රපටියක් පෙන්වල නැත. එකම නාට්‍ය ශාලාවකවත් නාට්‍යයක් මෙතෙක් පෙන්වල නැත කියල.** නමුත් මේ ගිය අය දුටුව එක්තරා ආකාරයකින්. දුටුවෙ කොහොමද? **තම තමන්ගේම මේ කෙලෙස් ලාටුවලින් මේවා අලවාගෙන නිපදවා ගත්ත. සංස්කරණය කරගත්ත.**

① **මෙන්න මේ විදියටම ලෝකසත්ත්වයා විඤ්ඤාණ තිරයේ සංස්කාර සන්තති**යෙන් නාමරූප චිත්‍රපටයක් මවාගන්නව.

සිනමා තිරයෙ ඇත්ත වශයෙන් වැටෙන්නෙ එක දර්ශනයයි එක අවස්ථාවක. සිනමා තිරවල ඉතාම ශීඝ්‍රයෙන් මේක කෙරෙන නිසා කෙනෙකුට හිතාගන්න අමාරුයි මේ එක දර්ශනයක් නොවෙයි කියල. අපි හිතමු, දැන් නාට්‍යයක නම් එක ජවනිකාවක් ඉවර වුනාට පස්සේ අනිත් ජවනිකාව එනකං තිරය පහතට යනව. ආයිත් ඉස්සෙනකං බලාගෙන ඉන්නවා නරඹන්නන්. නමුත් බලාගෙන ඉන්නෙ අර ලාටු ටික ලෑස්ති කරගෙන, ඒ ජවනිකාවත්, අර ජවනිකාවත් එකතුකරල නාට්‍යය හදාගන්න.

සිනමා තිරයෙ අන්තිමට කිසිවක් ඉතිරිවෙන්නෙ නැහැ. යම්කිසි ජවනිකාවක් සිනමා තිරයෙ වැටුනනම්, කලින් වැටුන ජවනිකාව ගියා ගියාමයි. ඊළඟට එන්න තියෙන ඒව තාම ආවෙත් නැහැ. ඒ වැටෙන දේත් එතන රැඳෙන්නෙ නැහැ. ඉතින් මෙතන තියෙන්නෙ එහෙම පිටින්ම ව්‍යාජ ස්වරූපයක්. රැවටිලි ස්වරූපයක්.

② දැන් අපි කල්පනා කරල බලමු. සමහර වෙලාවට අපිට දකින්න ලැබෙනව ඒදණ්ඩක් උඩින් යන බල්ලෙක්. සමහර විට හිටිගමන් මැදදි නැවතිලා වතුරට එබිල බලල, සමහරවිට වල්ගෙ

① 'නිවනේ නිවීම' 2 වෙනි වෙළුම 6 වන දේශනය. පිටුව 119
② 'නිවනේ නිවීම' 2 වෙනි වෙළුම 6 වන දේශනය. පිටුව 120



වනනව, ගොරවනව. එහෙම නැත්නම් සැරෙන් සැරේ ආයිත් අර වතුර දිහා බලනව. මොකක්ද මේ කරන්නෙ? වතුරෙ පෙනුන තමාගේ ඡායාව දැකල, බල්ල හිතනව මේ වෙන බල්ලෙක් කියල. සමහර විට මිත්‍රලීලාවකින් වල්ගෙ වනන්නෙ. සමහර විට ගොරවනව. එහෙම නැත්නම් එබිල බලනව, කුතුහලය නිසා. ඇලීම්, ගැටීම්, මෝහ. එතකොට බල්ල කල්පනා කරන්නෙ **පෙනෙන නිසා** - බල්ලෙක් පෙනෙන නිසා - බලනවයි කියල. නමුත් ඇත්ත වශයෙන්ම සිදුවෙන්නෙ මොකක්ද? **බලන නිසයි** පෙනෙන්නෙ. බල්ලා බලන නිසයි පෙනෙන්නෙ. නොබල හිටියනම් පෙනෙන්නෙ නැහැ. නමුත් බල්ලා කල්පනා කරන්නෙ පෙනෙන නිසා බලනව කියල. මෙන්න මේ විදියෙ දෙයක් මේ නාමරූපය පිළිබඳව, මේ සංස්කාරයන් පිළිබඳව මේ ලෝකයේ මේ අපේ ඉන්ද්‍රිය විඤ්ඤාණය පිළිබඳව සිද්ධවෙනව. **පටිච්චසමුප්පාදයේ රහස මෙතනයි තියෙන්නෙ.**

① අර චිත්‍රපටය ගැන නැවතත් කිව්වොත් **නරඹන්නෙක් නැති අවස්ථාවක අර සේයාරූපටය යැව්ව නම් චිත්‍රපටියක් කොතැනකවත් සටහන් වන්නෙ නැහැ.** සිතක් නැහැනෙ මෙතන. ඒක නිකං වැටුන විතරයි. නමුත් කවුරුවත් හිටියනම්, මේක ස්පර්ශ කළානම්, ස්පර්ශායතනවලින් ස්පර්ශ කළානම් - ඇහින් දැකල, කනෙන් අහල සිතෙන් ස්පර්ශ කළා නම් ආශාවෙන් යුක්තව - අන්න චිත්‍රපටියක් එතන ඇති උනා. නාට්‍යයක් ඇතිවුනා. නිෂ්පාදකයින් හිතනව ඔවුන්ය කියල මේව හැදුවෙ. **අවසාන වශයෙන් බලන කොට අර නරඹන්නන් තමයි නාට්‍යයක් චිත්‍රපටියක් නිපදවන්නෙ.**

ඒ වගේම මේ ලෝකෙ ඇති දේවලුත් මේ හැම එකක්ම තියෙනව කියල අපි හිතනව. **සක්කාය දිට්ඨිය කියල කියන්නෙ ඕකයි.** බල්ලගෙ තියෙන සක්කාය දිට්ඨිය නිසා තමයි කල්පනා කළේ වතුරෙ බල්ලෙක් ඉන්නව කියල. මා නොබැලුවත් බල්ලෙක් ඉන්නව. ඒ බල්ල පෙනෙන නිසයි මා බලන්නෙ කියල. නමුත් ඇත්ත වශයෙන්ම බල්ල **එබිල බලන නිසයි පේන්නෙ.** ② බුදුපියාණන් වහන්සේ

① 'නිවනේ නිවීම' 2 වෙනි වෙළුම 6 වන දේශනය. පිටුව 120
② 'නිවනේ නිවීම' 2 වෙනි වෙළුම 6 වන දේශනය. පිටුව 121

ප්‍රකාශ කළා, මේ දුක, මේ සියලුම දුක, පටිච්චසමුප්පන්නයි කියල.

ඊළඟට දුක කියල කියන්නෙ මොකක්ද? ඒක විග්‍රහ කරනව '***සංඛිත්තෙන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා***' - සැකෙවින් සැළකුවාම පංච උපාදානස්කන්ධයම දුකක්. එතකොට දුක හෙවත් මේ පඤ්චුපාදානක්ඛන්ධය පටිච්චසමුප්පන්නයි. බුදු පියාණන් වහන්සේ උපවාන කියන භික්ෂූන්වහන්සේට සංයුත් සඟියෙ නිදාන සංයුත්තයෙ සූත්‍රයක ප්‍රකාශ කරනව. "***පටිච්චසමුප්පන්නං ඛො උපවාන දුක්ඛං වුත්තං මයා කිං පටිච්ච ඵස්සං පටිච්ච***" උපවාන මවිසින් දුක පටිච්චසමුප්පන්නයි දේශනා කරන ලදී. කුමක් ප්‍රත්‍යය කරගෙනද? ***කිං පටිච්ච ඵස්සං පටිච්ච*** ස්පර්ශය ප්‍රත්‍යය කරගෙනයි. එතකොට මෙයිනුත් පෙනෙන්නෙ සළායතනයන්ගෙන් සපර්ශ කිරීම නිසා තමයි, මේ පඤ්චුපාදානස්කන්ධය ඇති වෙන්නෙ.

මෙන්න මේ විදියට අපි කල්පනා කරල බැලුවාම, යමක් පටිච්චසමුප්පන්න කියල කියන්නෙ සළායතනයන්ගෙන් ස්පර්ශකිරීමයි. '***අනිච්ච***' කියල කියන්නෙත් ඒකයි.

චිත්‍රපටියක් හදල තිබුණ නොවෙයි. මේ ස්පර්ශ කිරීම නිසා ඇති උනා. ඒවගේම '***සංඛතං පටිච්චසමුප්පන්නං***' මේකෙ සංඛත ස්වභාවය, සකස් කරන ලද ස්වභාවය, එන්නෙත් ඔන්න ඔය ස්පර්ශය නිසයි. මේ විදියට බලනකොට විඤ්ඤාණය '***අභිසංඛතයි***' කියල කියන්නෙ, ***අභිංසඛත විඤ්ඤාණය*** කියල කියන්නෙ, අන්න අර නාමරූපයෙ බැඳෙන විඤ්ඤාණය. චිත්‍රපටියක් නරඹන අවස්ථාවෙ ඒ තිරයෙ වැටෙන ජවනිකා ඒ බලන පුද්ගලය හඳුනාගන්නව තමාගේ රුචිඅරුචිකම් අනුව. ඒව වින්දනය කරනව. ඒවගේ අර නාමරූපය ආත්මත්වයෙන් ගැනීම නිසා, නාමරූපයෙහි විඤ්ඤාණය බැඳෙනව. එබඳු නාමරූපයෙහි පිහිටි විඤ්ඤාණයට තමයි, '***අභිසංඛත විඤ්ඤාණය***' කියල කියන්නෙ.



'එතකොට නාමරූපයක් නැති, නාමරූපයක් පිළිබිඹු නොවන විඤ්ඤාණයකුත් තියෙන්න පුළුවන්ද?' පුළුවනි. ඒකට තමයි '***අනිදස්සන විඤ්ඤාණය***' කියන්නෙ.

ඔන්න දැන් ඊළඟට අපි එන්නෙ ඉතාමත්ම ගැඹුරු ධර්මකොට්ඨාශයකට. ඒ කියන්නෙ, පෙරපර දෙදිග පඬිවරු නොයෙකුත් විදියට විග්‍රහකරන්න උත්සාහ කරන ඉතාමත්ම ගැඹුරු ගාථාධර්මයක් දීඝනිකායේ කෙවඩ්ඪ සූත්‍රයේ අගට සඳහන් වෙනව-

| | | |
|---|---|---|
| ① *විඤ්ඤාණං අනිදස්සනං* | - | *අනන්තං සබ්බතොපභං* |
| *එත්ථ ආපොච පඨවී* | - | *තෙජෝ වායො න ගාධති* |
| *එත්ථ දීඝඤ්ච රස්සඤ්ච* | - | *අණුං ථූලං සුභාසුභං* |
| *එත්ථ නාමඤ්ච රූපඤ්ච* | - | *අසෙසං උපරුජ්ඣති* |
| *විඤ්ඤාණස්ස නිරොධෙන* | - | *එත්ථෙතං උපරුජ්ඣති* |

මුල් පදේ තිබෙන වචන කීපය තමයි ඉතාමත්ම ගැටළු සහිත බව පෙනෙන්නේ කාටත්. ඒක නිසා ඒ පදය එහෙමම අරගෙන,

අනිදස්සන වූ, අනන්ත වූ, සබ්බතො පභ වූ විඤ්ඤාණයක
පඨවි අපෝ තෙජො වායො යන මහාභූත ධර්ම සතරත්,
දිග - කොට, අණු සථූල - සුභ අසුභ කියන ඒ ප්‍රඥප්තිත්
නාමයත් සහ රූපයත් මේ හැම එකක්ම 'උපරුද්ධ' වෙනව, නැතිවෙනව,

විඤ්ඤාණයේ නිරෝධයෙන් මේ සියල්ලම උපරුද්ධ වෙනව. වළක්වනු ලබනව කියන එකයි සාමාන්‍ය අදහස.

② දැන් අපි ක්‍රමානුකූලව මුල් පදයේ තිබෙන ඒ වචනවල අර්ථ විමසන්න බලමු. පළමුවෙන්ම '***විඤ්ඤාණං අනිදස්සනං***' කියන තැන අනිදස්සනං කියන වචනය. අනිදස්සනං කියන වචනයේ අර්ථය - '***නිදස්සන***' කියන වචනයේ සාමාන්‍ය අර්ථය කාටත් ප්‍රකටයි. නිදර්ශනය කියල පාවිච්චි වෙනව. යමක් පෙන්නුම් කරන, යමක් විදහා දක්වන දෙයට නිදර්ශනය කියල කියනව. මේකයි මූලික අර්ථය.

① 'නිවනේ නිවීම' 3 වෙනි වෙළුම 7 වන දේශනය. පිටුව 126
② 'නිවනේ නිවීම' 3 වෙනි වෙළුම 7 වන දේශනය. පිටුව 127

මේ මූලික අර්ථය පවා එක්තරා විධියකට යමකට විශේෂණ වශයෙන් යෙදුන අවස්ථාවක් අපට දකින්ට ලැබෙනව අංගුත්තර නිකායෙ දසකනිපාතයෙ පඨමකොසල සූත්‍රයෙ අභිභායතන පිළිබඳ සඳහන් වන, ඒ කියන්නේ කසිණ නිමිති වගේ දේ ගැන සඳහන් වන සූත්‍රයක. කසිණ නිමිත්තක් වශයෙන් පාවිච්චි කරන්න පුළුවන් සමහර විට දියබෙරලිය මල. ඒ දියබෙරලිය මල පිළිබඳව මෙන්න මෙහෙම පාඨයක් සඳහන් වෙනව.

*'උම්මාපුප්ඵං නීලං නීලවණ්ණං නීලනිදස්සනං නීලනිභාසං.'*

දියබෙරලිය මල 'නිල්වූ, නිල්වණ් වූ නිලක් පෙන්නුම් කරන,

*'නීලනිදස්සනං'*

නිලක් පෙන්නුම් කරන, එහෙම නැත්නම් නිලට නිදර්ශනයක් වන,

*'නීල නිභාසං'*

නිල් දිස්නයක් ඇති, නිල් දීප්තියක් ඇති.

මෙතන **'*නීල නිදස්සනං*'** කියන යොදල තියෙනව. නිලට නිදර්ශනයක් වන, එහෙම නැත්නම් නිලක් විදහා දක්වන කියන එකයි. එතකොට මේ විදියට ගත්තහම **'*අනිදස්සන*' කියන එක අපට හිතාගන්න පුළුවන් යමක් විදහා නොදක්වන යමක් පෙන්නුම් නොකරන කියන අර්ථයයි.**

① *අනිදස්සන* කියන වචනයෙ මේ අර්ථය ඇති බවට ඉතාමත්ම හොඳ සාධකයක් අපට ලැබෙනව මජ්ඣිම නිකායෙ කකචූපම සූත්‍රයෙන්.

ඒක නිකම් අහම්බෙන් වගෙයි ඒ උපමාව යෙදෙන්නෙ. බුදුපියාණන් වහන්සේ එක අවස්ථාවක සංඝයා වහන්සේලාට යම්කිසි උපමාවක් ඉදිරිපත් කිරීම සඳහා පළමුවෙන්ම ප්‍රශ්නයක් අසනවා.

① 'නිවනේ නිවීම' 3 වෙනි වෙළුම 7 වන දේශනය. පිටුව 127



*'සෙය්‍යථාපි භික්ඛවෙ පුරිසො ආගච්ඡෙය්‍ය ලාඛං වා හලිද්දිං වා නීලංවා මඤ්ජිට්ඨං වා ආදාය'*

'මහණෙනි, යම් සේ පුරුෂයෙක් රතු හෝ කහ හෝ නිල් හෝ මදටිය හෝ ඔය විදියේ පාටක් අරගෙන එන්නේද'

*" සො එවං වදෙය්‍ය - අහං ඉමස්මිං ආකාසෙ රූපානි ලිඛිස්සාමි රූපපාතුභාවං කරිස්සාමි "*

ඇවිල්ල මෙන්න මෙහෙම කියනවා.
"මම මේ අහසෙහි රූප අඳිනව, රූප පහළ කරනව"
යම්කිසි පුරුෂයෙක් එහෙම කිව්වොත් ඒක කරන්න පුළුවන් වැඩක්ද? කියල බුදුරජාණන් වහන්සේ පළමුවෙන්ම සංඝයා වහන්සේලාගෙන් විමසනව. සංඝයා වහන්සේලා පිළිතුරු දෙනව "ඒක කරන්න බැරි දෙයක්, ස්වාමීනි."

① ඒකට හේතුව මෙන්න මෙහෙම ප්‍රකාශ කරනව. *" අයං හි භන්තෙ ආකාසො අරූපී අනිදස්සනො, තත්‍ථ න සුකරං රූපං ලිඛිතුං රූපපාතුභාවං කාතුං"*

මක්නිසාද, ස්වාමීනි මේ අහස අරූපී දෙයක්. රූප ධර්මයක් නොවෙයි. රූප ස්වභාවයක් නැති දෙයක්. *"අනිදස්සනො"* - ඔන්න අපිට ඕනෑ කරන වචනෙ එතන තියෙනව. *"අරූපී අනිදස්සනො."*

යමක් විදහා දක්වන්ට හැකියාවක් නැහැ අහසෙ. අන්න ඒක නිසා තමයි ***"තත්‍ථ න සුකරං රූපං ලිඛිතුං රූපපාතුභාවං කාතුං"***

ඒක නිසා රූපයක් ඇඳීම හෝ රූපයක් අහසෙහි පහළ කිරීම හෝ කළ හැක්කක් නොවේ.

① 'නිවනේ නිවීම' 3 වෙනි වෙළුම 7 වන දේශනය. පිටුව 128

මෙන්න මෙතන යෙදිල තියෙනව අහසෙහි රූපයක් අඳින්න ගියාම සායමකින් ඇඟිල්ලකින් ඇන්දට ඒක හිටින්නෙ නැහැ. ඒක පෙන්නුම් කරන්නෙ නැහැ. විදහා දක්වන ස්වභාවයක් අහසෙහි නැහැ. අන්න ඒ වගේ. එතන '***අනිදස්සනො***' කියල යෙදිල තියෙනව.

දැන් එතකොට අපි මේ අනිදස්සන කියන වචනය විඤ්ඤාණයට ගැලපෙනවද කියල බලමු. "***විඤ්ඤාණං අනිදස්සනං***" විඤ්ඤාණය 'අනිදස්සන' වෙන්නෙ කොහොමද? අහස '***අනිදස්සන***' බව අර උපමාවෙන් අපට තේරුම් ගන්න පුළුවන්. නමුත් විඤ්ඤාණයක් 'අනිදස්සන' වෙන්නෙ කොහොමද? * * * *

① **විඤ්ඤාණයේ යම් කිසිවක් පිළිබිඹු කරන - අර කන්නාඩියක වගේ - යම්කිසි අමුතු ස්වභාවයක් තියෙනව. "*විඤ්ඤාණං අනිදස්සනං*"** කියල කියන්නෙ, මෙතන මේ රහතන් වහන්සේගේ විමුක්ත සිත පිළිබඳ ලක්ෂණයක්. යමක් පිළිබිඹු කරන්නේ නැහැ. මොකක්ද පිළිබිඹු නොකරන්නේ? නාමරූපයක්.

සාමාන්‍ය පුද්ගලයා ප්‍රත්‍යවේක්ෂා කරල බලනකොට නාමරූපයක් ඒ පුද්ගලයාට පෙනෙනව, 'මමය' 'මගේය' කියල කියන්න පුළුවන් විදියෙ. බල්ලට අර තමාගේ ඡායාව පෙනුනා වගේ. ප්‍රත්‍යවේක්ෂණයේදී නොරහත් කෙනෙකුට නාමරූපයක් දකින්නට ලැබෙනව. මේ නාමරූපය තමයි කෙනෙක් ආත්මත්වයෙන් ගන්නෙ. නමුත් රහතන් වහන්සේගේ විඤ්ඤාණය '***අප්පතිට්ඨිත විඤ්ඤාණයක්.***' අපි කලින් දේශනාවලත් සඳහන් කළා ***පතිට්ඨිත විඤ්ඤාණයත්, අප්පතිට්ඨිත විඤ්ඤාණයත්*** ගැන.

නාමරූපයක පිහිටි විඤ්ඤාණය තමයි නොරහත් විඤ්ඤාණය. ***පතිට්ඨිත විඤ්ඤාණය.***

① 'නිවනේ නිවීම' 3 වෙනි වෙළුම 7 වන දේශනය. පිටුව 129



නාමරූපයෙන් මිදුනු, නාමරූපයක නොපිහිටි විඤ්ඤාණය ***අප්පතිට්ඨිත විඤ්ඤාණයයි.***

එතකොට ***පතිට්ඨිත විඤ්ඤාණය*** ආපසු හැරී බැලීමේදී. එහි පිහිටියාවූ නාමරූපය පිළිබිඹු කරනව,

***අප්පතිට්ඨිත විඤ්ඤාණයට*** ඒ විධියට ප්‍රත්‍යවේක්ෂාවෙදී නාම රූපයක් හමුවන්නේ නැහැ.

නාමරූපයක ඇලීම් බැඳීම් ආදී ඒ කිසිවක් නැහැ ඒ රහතන් වහන්සේට. මමය, මගේය කියන හැඟීමක් නැහැ. කොටින්ම කිව්වොත් නාමරූපයේ බැඳෙන්නේ නැතිව ඒක විනිවිද යෑමක් වගේ දෙයක් වෙනව. '***අනිදස්සන විඤ්ඤාණය***' කියන එකේ අර්ථය ගන්න තියෙන්නෙ අන්න ඒ විදියටයි. * * * *

① ඊළඟට අපි '***අනන්තං***' කියන වචනය ගැනත් හිතා බලමු. ගැඹුරු දිය ගැන අපි ප්‍රකාශ කරන කොට, එතන කිව්ව ලඹයක් වැනි දෙයක් දමල තමයි මේකෙ ගැඹුර මනින්නේ කියල. රහතන් වහන්සේලාගේ විඤ්ඤාණය පිළිබඳව රූප ධර්මයන් නැති නිසා - ඒකට සූචකයක් වශයෙන් පෙන්නුම් කරන රූප ධර්මයන් නැති නිසාම - ඒ විඤ්ඤාණය අනන්තයි. තවත් අර්ථයකින් එය අනන්තයි. අපි දන්නව දිග - කොට ආදී භේද ගැන අපි කලින් සඳහන් කළා සාපේක්ෂක ප්‍රඥප්ති කියල. තේරුම් ගැනීම පහසු වීමට අපි මේවාට ඇඳුතුපද කියල කිව්ව. 'ඇඳුතු' කියන පදයෙ වෙන නොයෙකුත් අර්ථ තියෙන්න පුළුවනි. නමුත් මේ දේශනා මාලාවට උපකාර කර ගැනීම සඳහා ඒ වචනය යොදාගත්ත. මේවා ලෝක ව්‍යවහාරයේ සාමාන්‍යයෙන් පවතින්නේ ඇඳුතු හැටියට නිසා. දිග, කොට, සුභ, අසුභ, කුඩා, මහත් ආදී මේ ප්‍රඥප්ති තියෙනව ලෝකෙ. * * * *

① 'නිවනේ නිවීම' 3 වෙනි වෙළුම 7 වන දේශනය. පිටුව 130

① මේ ප්‍රඥප්තිවල ද්වයනිශ්‍රිත ස්වභාවයක් තියෙනව. දෙකක් අතරෙයි පවතින්නෙ. හරියට යම්කිසි රාමුවක් ඇතුළේ දාපුව වගෙයි. දැන් අපි යම්කිසි වැඩකට ලී කෑල්ලක් ඕනෑ වෙලා සොයන කොට මේ ලී කෑල්ල දිග වැඩියි කියල කියන්නේ මක් නිසාද? අපිට ඕනෑ කරන්නේ ඊට වඩා කොට එකක්. කොට මදියි කියන්න ඕන එකට අපි දිග වැඩියි කියල කියනව. මේක 'කොට වැඩිය' කියල කීවොත්? ඒකෙ අදහස 'දිග මදි' කියන එකයි. ඔන්න එතකොට දිග-කොට කියන එක එක්තරා රාමුවක් ඇතුළෙ. ඇත්ත වශයෙන්ම කියනවානම් හැම මානයක්ම -හැම මිනුමක්ම- යම්කිසි පරිමානයක් තුළයි කෙරෙන්නෙ. එක රාමුවක් තුළයි කෙරෙන්නේ.

ඒ අඊයෙනුත් එතකොට සාමාන්‍ය ලෝකයාගේ සිතුම් පැතුම් වල කොන් තිබෙනව. අන්තවාදියි. ඒ කොනයි මේ කොනයි. අපි අර මුල ඉඳලම ***අත්ථි - නත්ථි***, ඇත - නැත ආදී වශයෙන් ලෝකයා අන්ත දෙකක් ඇසුරු කරනව කියල ප්‍රකාශ කළේ ඉතාමත්ම පුළුල් අර්ථයකින්. **ලෝකයා හැම තිස්සෙම යම්කිසි රාමුවක් ඇතුළෙයි කල්පනා කරන්නේ.** අර 'දිග-කොට' ආදී ප්‍රඥප්තිවල රැඳිල බැඳිලයි ඉන්නෙ. ඔන්න එතකොට '***අනන්තං***' කියන වචනයේ අර්ථය අපට ඒ අතින් ගන්න පුළුවන්. රහතන් වහන්සේගේ ඒ විඤ්ඤාණය පුදුම අන්දමට අර විදියේ සීමාවක් නැතිව-ගිහිල්ල බැඳෙන්නෙ නැතිව, රැඳෙන්නෙ නැතිව-අනන්ත ස්වභාවයක් දරනව. * * * *

② '***විඤ්ඤාණං අනිදස්සනං - අනන්තං සබ්බතො පභං***"- දැන් අපි "***සබ්බතො පභං***" කියන වචනය තේරුම් ගන්න බලමු. අපි නාට්‍යය ගැන, එහෙම නැත්නම් සිනමාව ගැන, කථා කරන කොට ප්‍රකාශ කළා, ඒ සිනමා තිරයෙ වැටෙන චිත්‍රයක, යම් කිසි ජවනිකාවක, ඒ නරඹන්නා - ප්‍රේක්ෂකයා -ඇලෙන්නෙ ඒක 'මමය' කියල හඳුනාගන්නේ, ඒ චරිත එක්ක තමන් හඳුනාගන්නේ මක්නිසාද?

① 'නිවනේ නිවීම' 3 වෙනි වෙළුම 7 වන දේශනය. පිටුව 131
② 'නිවනේ නිවීම' 3 වෙනි වෙළුම 7 වන දේශනය. පිටුව 135-136



අඳුරු පසුබිම නිසා මෝහනයට වැටෙනව. එක්තරා විධියක මෝහනයකට වැටෙනව. **ආස්වාදය කියන්නේ ඒකයි.**

① ඇත්ත වශයෙන්ම එක්තරා ආලෝකයක් තියෙනව සිනමා ශාලාවෙ. ඒ අලෝකය ඉතාමත්ම සීමිතයි. ඒක සමහර විට තිරයට විතරක් වැටෙන ආලෝකයක්. අපි අර කලින් දේශනයක සඳහන් කළා දවල් කාලයේ චිත්‍රපටියක් පෙන්වන කොට දොරවල් වහල, කළුතිර ආදියත් දාලයි ඒක පෙන්වන්නෙ කියල.

"***සබ්බතො පභං***". දවල් කාලයේ අර විදියට චිත්‍රපටියක් බලන අතරේ, කෙනෙක් හොඳට ඒකටම යොමු වෙලා, ඒකට මුළාවෙලා - හිටිගමන්ම දොර ජනෙල් එහෙම විවෘත වුනොත්, අර තිර ආදිය ඉවත් වුනොත්, මොකක්ද සිද්ධ වෙන්නෙ? එහෙම පිටින්ම සිනමා ලෝකයෙන් එළියට එනව. චිත්‍රපටිය නතර වුනෙ නැති වෙන්න පුළුවනි. නමුත් හාත්පසින්ම ආලෝකය ආව නිසා, ඒ සම්පූර්ණ ආලෝකයෙන් තිරයෙ තිබුණු සීමිත ආලෝකය මැකිල ගියා. ඒ චිත්‍රපටියේ තිබුණු ආස්වාද පක්ෂය නැතිවෙලා ගියා .

චිත්‍රපටිය පිළිබඳව දක්වූ ධර්මතාවම ඊට වඩා ගැඹුරු අර්ථයකින් ගන්න පුළුවන්. මේ රහතන්වහන්සේලා පිළිබඳව වන පරිවර්තනයේදී, ඒ ප්‍රඥා ආලෝකය පහළවීමත් සමඟම සංස්කාර විසංස්කාර වෙනව. බාහිර ලෝකයාට ඒව සංස්කාර හැටියට පෙනුනට, රහතන්වහන්සේට ඒවා සංස්කාර නොවෙයි. මක්නිසාද? භවයක් මැවෙන්නේ නැහැ.

***පඤ්ඤා භාවෙතබ්බා - විඤ්ඤාණං පරිඤ්ඤෙය්‍යං***

විඤ්ඤාණය පිරිසිඳ දතයුත්තක්. විඤ්ඤාණයේ ස්වභාවය තේරුම් ගත යුත්තක්. එතකොට කෙනෙක් අහන්න පුළුවන් "කොහොමද? මේ විඤ්ඤාණයෙන් නේ අපි හැමදෙයක්ම කරන්නෙ. කොහොමද විඤ්ඤාණය තේරුම් ගන්නේ" නමුත් බුදුරජාණන් වහන්සේ ඒකට මාර්ගයක් පෙන්නුම් කරල තියෙනව.

① 'නිවනේ නිවීම' 3 වෙනි වෙළුම 7 වන දේශනය. පිටුව 136

'***පඤ්ඤා භාවෙතබ්බා - විඤ්ඤාණං පරිඤ්ඤෙය්‍යං***' භාවිත වූ ප්‍රඥාවෙන් - ප්‍රඥාව භාවිත වෙන කොට, විඥාණය පිරිසිඳ දැනගන්න පුළුවන් වෙනව.

කොටින්ම කියනව නම්, විඥාණය අර සීමිත ආලෝකය වගේ පටුයි. ***අභිසංඛත විඤ්ඤාණය.*** සාමාන්‍ය නොරහත් විඥාණයට අපි යෙදූ වචනය තමයි '***අභිසංඛත විඤ්ඤාණය***'- නාමරූපයේ හිරවෙලා තියෙන විඥාණය. තිරයෙ බැඳිල තියෙන නරඹන්නන්ගේ ඇස් දෙක වගේ. ඔන්න ඔය විදියට සීමිත පටු ස්වභාවයක් තියෙනව සාමාන්‍ය ලෝකයාගේ විඥාණයේ. මේක ප්‍රඥාවෙන් එහෙම පිටින්ම ආලෝකවත් වූ හැටියේ සිද්ධ වෙන්නෙ කුමක්ද? "***සබ්බතො පභං***" හැම පැත්තෙන්ම ප්‍රභාව ආවාම අර ඉස්සෙල්ල තිබුන අවිද්‍යා අඳුරු රාමුව ඉවත් වෙනව. ඒ අවිද්‍යා අඳුරු රාමුවෙන් මිදුන විමුක්ත විඥාණයයි මෙතන '***සබ්බතොපභ විඤ්ඤාණය***' කියල කියන්නෙ.

① අංගුත්තර නිකායෙ චතුක්ක නිපාතයේ සූත්‍රයක මෙහෙම සඳහන් වෙනවා

"***චතස්සො ඉමා භික්ඛවෙ පභා කතමා චතස්සො. චන්දප්පභා සූරියප්පභා අග්ගිප්පභා පඤ්ඤාප්පභා. ඉමා ඛො භික්ඛවෙ චතස්සො පභා. ඒතදග්ගං භික්ඛවෙ ඉමාසං චතස්සන්නං පභානං යදිදං පඤ්ඤාප්පභා.***"

① " මහණෙනි මේ ප්‍රභාවෝ හතර දෙනෙක් ඇත. ආලෝක හතරක් ඇත.

"***කතමා චතස්සො***" - මොනවද හතර,
***චන්දප්පභා*** - චන්ද්‍රප්‍රභාව,
***සූරියප්පභා*** - සූර්ය ප්‍රභාව,
***අග්ගිප්පභා*** - අග්නි ප්‍රභාව.
***පඤ්ඤාප්පභා*** - ප්‍රඥා ප්‍රභාව.

① 'නිවනේ නිවීම' 3 වෙනි වෙළුම 7 දේශනය. පිටුව 137



***ඉමා ඛො භික්ඛවෙ චතස්සො පභා.***

මේවායි මහණෙනි ප්‍රභා හතර,

" ***ඒතදග්ගං භික්ඛවෙ ඉමාසං චතස්සන්නං පභානං යදිදං පඤ්ඤාප්පභා***" මහණෙනි මේ ප්‍රභා හතර අතුරින් ප්‍රඥා ප්‍රභාවම අග්‍රයි. * * * *

① එතකොට අපට පේනවා ප්‍රභාස්වර සිත පිළිබඳවයි මේ ප්‍රකාශ කරන්නේ. අර '***අනිදස්සන, අනන්ත සබ්බතොපභ විඤ්ඤාණය.***' රහතන් වහන්සේ ගේ සිත පිළිබඳවයි මෙතන මේ කියවෙන්නෙ.

සිනමා උපමාව නැවතත් මතක් කර ගත්තොත්, අර විදියට දවල් කාලයේ පෙන්වන චිත්‍රපටියෙ, **කෙනෙක් සම්පූර්ණයෙන්ම අර චිත්‍රපටියේ නිමග්න වෙලා, එහෙම පිටින්ම සිනමාලෝකයෙ ගැලිල ගත කරන අවස්ථාවෙ, හදිසියෙන්ම විශාල ආලෝකයක් ඇවිත් සම්පූර්ණ ශාලාවම ඒකාලෝක වුනානම් මොකද වෙන්නේ?**

අපි මේ දේශනාවෙ නිර්වාණය අරමුණු කරගෙන යොදාගත්ත වචන එක්තරා සීමිත අර්ථයකින් නැවතත් මතක් කරගත්තොත් "***සබ්බ සංඛාර සමථයක්***"- ගැන අපි සඳහන් කළා. අර චිත්‍රපටිය පිළිබඳ සංස්කාරයන් සමථය වෙනව. ඒ කියන්නේ අර නළු නිළියන්ගේ ඇඳුම් පැළඳුම් ඒව ඔක්කොම, එහෙම පිටින්ම, සමහර විට ඒක වෛවර්ණ චිත්‍රපටියක් වෙන්න පුළුවන්. **වෛවර්ණ චිත්‍රපටිය විවර්ණ වෙනවා, අර ආලෝකය ආවාම. තිරයෙ තියෙන දර්ශනය, පිටතින් පැමිණි අලෝකයෙන් එහෙමම මැකිල යනව.** ඒකෙ ප්‍රතිඵලය මොකක්ද?

'***සබ්බසංඛාර සමථො***' අර පුද්ගලයාගේ සිතේ තිබුණ සංස්කාරයන්, චිත්‍රපටි නිෂ්පාදකයන් විසිනුත්, තමාගේ සිතිනුත්, ඇතිකර ගත්තු අර සංස්කාර සමූහය තාවකාලිකව හරි සංසිඳෙනව.

① 'නිවනේ නිවීම' 3 වෙනි වෙළුම 7 දේශනය. පිටුව 138

**"සබ්බූපධි පටිනිස්සග්ගො"**

කෙනෙක් චිත්‍රපටියක් බලන කොට අමුතු ලෝකයක ඉන්නෙ. අත්දැකීම් රාශියක් එකතු කර ගන්නව - ඒ අත්දැකීම් පොදිය ගිලිහිල යනව.

**'තණ්හක්ඛයො'** හොඳට ආශාවෙන් බලාගෙන හිටිය වෛවර්ණ දර්ශණයට තිබුණ තණ්හාව නැතිවෙලා යනව.

**'විරාගො'** - විරාග යන වචනයෙ අර්ථ දෙකක් තිබෙන බව අපි කිව්ව. නොඇල්ම පමණක් නොවෙයි. නො ඇල්මට හේතුවන සායම සේදී යාම - පාට සේදී යාම. එතකොට අර පාට සේදිලා ගියෙ අමුතු දේකින් නොවෙයි. විඤ්ඤාණයේ සීමිත ආලෝකය ප්‍රඥාවේ අසීමිත ආලෝකයෙන් වැහිල ගියා, මැකිලා ගියා.

**'නිරොධො'**- 'නිරොධ' කියන්නෙ නැවතීම. චිත්‍රපටිය එතැනම නතර උනා. සමහර විට අර යන්ත්‍ර ක්‍රියා කරනව වෙන්න පුළුවන්.

චිත්‍රපටියක් අවසාන වශයෙන් නිෂ්පාදනය කරන්නේ නරඹන්නාමයි, ප්‍රේක්ෂකයාමයි. එතකොට නිෂ්පාදනය කළ එක්කෙනාටම තමයි චිත්‍රපටිය නවත්තන්න පුළුවන්. අන්න නිරෝධය එතනමයි. චිත්‍රපටිය එතනම නතර උනා.

**"නිබ්බාන"** නිවීම. යම්කිසි ආවේග, උද්වේග, සංවේග ඇති වෙලා තිබුන නම් චිත්‍රපටිය නිසා, ඒව එහෙම පිටින්ම මොහොතකට හරි සංසිඳෙනව අර ආලෝකය ආවාහම. * * * *

① මේ ගාථාවෙ අවසාන පදය ගැනත් යමක් කියන්න වෙනව. අවසාන පදේ තියෙන්නේ ***'විඤ්ඤාණස්ස නිරොධෙන එතෙත්තං උපරුජ්ඣති.'*** දැන් අර නාමයත් රූපයත් නිරුද්ධ උනා. ඇත්ත වශයෙන්ම නාමරූප

① 'නිවනේ නිවීම' 3 වෙනි වෙළුම 7 වන දේශනය. පිටුව 139



නිරෝධය වගේ තමයි. සිනමා තිරේ තිබුන ඔක්කොම දේවල් මැකිල ගියා කියන එක වගේ නාමරූපය නැති උනා.

***විඤ්ඤාණස්ස නිරොධෙන***"- මෙතන විඤ්ඤාණස්ස නිරොධෙන කියන්නේ මක් නිසාද? අර අභිසංඛත විඤ්ඤාණයයි මෙතැන කියවෙන්නෙ. අර කලින් තිබුණ අභිසංඛත විඤ්ඤාණයෙ නිරෝධයයි. " ***විඤ්ඤාණස්ස නිරොධෙන - එතෙත්තං උපරුජ්ඣති***" ඒ අභිසංඛත විඤ්ඤාණයාගේ නිරෝධයෙන් මේ සියල්ල උපරෝධනය වෙනව.

① විමුක්ත තත්ත්වය තේරුම් ගැනීමට එක්තරා ඉඟියක් ලබාගන්න පුළුවන් - මෙතෙක් අපි ව්‍යවහාර කළ චිත්‍රපටිය, නාට්‍යාදිය පිළිබඳ උපමාවෙන්. ඒක නැවතත් අපි සිහිපත් කර ගත්තොත්, සාමාන්‍යයෙන් චිත්‍රපට නිෂ්පාදකයින් සමහර ත්‍රාසජනක දර්ශන මවාපෑමට යොදාගන්න උපක්‍රම ඉතාමත්ම සියුම්. සමහරවිට චිත්‍රපටියක් නරඹන්නන් - ප්‍රේක්ෂකයින් - ත්‍රාසයෙන් මුසපත් කරවන අන්දමේ මහා ගිනිගැනීම්, මන්දිර ගිනි ගැනීම්, හැටියට පෙන්වන්න ඒ අය පාවිච්චි කරන්නෙ මොනවද? කඩදාසි ගෙවල්. කඩදාසි ගෙවල් වලට ගිනි තියනව. නමුත් ඒ දර්ශනය නරඹන තැනැත්තා රැවටෙනව, මහා මන්දිරයක් ගිනි ගන්නව කියල. ඒ වගේ මහා භයානක වාහන අනතුරු දක්වීමට සෙල්ලම් බඩු පාවිච්චි කරන්නෙ.

මේ භවනාටකයෙත් තියෙනව ඔන්න ඔය විදියේ ත්‍රාසජනක දර්ශන. ඒවායේ ත්‍රාසජනක ස්වභාවයක් තිබුණට මොකද? නියම තත්ත්වය, නරඹන්නන් ඇත්ත වශයෙන්ම තේරුම්ගන්නව නම්, නරඹන්නාට ඒ අවස්ථාවෙ වැටහෙනව නම්, මේව කඩදාසි ගෙවල්, මේ සෙල්ලම් බඩු වගයක් කඳුමුදුන් වලින් පෙරලෙන්නේ කියල, එහෙම වැටහීමක් එනව නම්, ඒ අයට ත්‍රාසය වෙනුවට ඇතිවෙන්නේ

① 'නිවනේ නිවීම' 3 වෙනි වෙළුම 8 වන දේශනය. පිටුව 154

හාසයක්. අන්න ඒ වගේම මේ භව නාටකයෙත් තිබෙනව ත්‍රාසජනක පැත්තකුත්, හාසජනක පැත්තකුත්.

① මේ වචන දෙකම අඩංගු වෙනව 'සංවේග' කියන වචනයෙ. සංස්කාරයන් පිළිබඳව සංවේගය ඇතිකර ගැනීමේදී මේ තත්ත්ව දෙකම අපට කිට්ටුකරගන්න පුළුවනි. සාමාන්‍ය ලෝකයාට පෙනෙන්නෙ මේ භවනාටකයෙ අර ත්‍රාසජනක පැත්තයි. මක්නිසාද - අවිද්‍යාව නිසා. නමුත් රහතන්වහන්සේට - විමුක්ත පුද්ගලයාට - මේ භවනාටකයේ හාසජනක පැත්තකුත් පෙනෙනව. ඒකට එක්තරා නිදර්ශනයක් හැටියට දක්වන්න පුළුවනි බුදුපියාණන් වහන්සේ, ඒ වගේම සමහර විට මුගලන් මහරහතන් වහන්සේ වැනි ඍද්ධිමතුන් වහන්සේලා, මේ සංසාරයේ නොයෙකුත් සත්ත්වයින් රූකඩ රැඟුමක් වගේ කර්මානුරූපව ඒ ඒ භවවල උපදින ආකාරය දකල සමහර අවස්ථාවල '***සිතුප්පාදයක්***'- මඳ සිනහවක් - පහළ කළා කියල සඳහන් වෙනව.

මේක ඇත්තවශයෙන්ම උපහාසයක් වශයෙන් හෝ අකරුණාවකින් හෝ කෙරෙන දෙයක් නොවෙයි. නමුත් මේකෙ එක්තරා ඉඟියක් තියෙනව. මේ හසිතුප්පාදයක් ඇතිවීම, මේ භවනාටකයේ හාස්‍යජනක පැත්ත දකීම වගේ. සමහරවිට මහ උසස් තත්ත්වවල වැජඹුනු අය ප්‍රේතයින් හැටියට, එහෙම නැත්නම් ඊටත් වඩා පහත් තත්ත්ව වල උපදිනව දකල, මේ භවනාටකයේ නිස්සාර බව වටහාගැනීමෙනුයි මඳ සිනහවක් පහළ වෙන්නෙ.

② ඒකත් හරියට චිත්‍රපටියක පෙන්නුම් කරන දේවල්වල අනිත්‍යස්වභාවය, මවාපෑම් ස්වභාවය, හරියට අවබෝධ වුන කෙනෙකුට ඇතිවන තත්ත්වය වගේ. මේ භවනාටකය ගැන කල්පනාකරල බැලුවාම මේ සංසාරගත සත්ත්වයා හරියට අර ***උද්ධම්භාගිය*** සංයෝජන වලින් ඉහලට ඇදෙන ***ඔරම්භාගිය*** සංයෝජන වලින් පහලට ඇදෙන රූකඩ ගොඩක් වගේ. නූල් වලින් ඉහලට

① 'නිවනේ නිවීම' 3 වෙනි වෙළුම 8 වන දේශනය. පිටුව 154

② 'නිවනේ නිවීම' 3 වෙනි වෙළුම 8 වන දේශනය. පිටුව 155



පහලට ඇදෙන රූකඩ ගොඩක් වගේ. මෙන්න මේ රූකඩ දකල තමයි රහතන්වහන්සේලාට මේකෙ මේ නිස්සාරත්වය අනුව එක්තරා විධියෙ හසිතුප්පාදයක් ඇතිවන්නේ.

ඒ විධියට කල්පනා කරල බලනකොට මේ භවනාටකයේ රඟ දැක්වීමට යොදන ප්‍රධාන මූලද්‍රව්‍ය තමයි සතර මහා භූතයින් - පඨවි, අපො, තෙජො, වායො. අර චිත්‍රපටියක, නාට්‍යයක පවා ඒ දර්ශන මවාපෑමට සමහර විට එකම දේ යොදාගන්න පුළුවන් කීප ආකාරයකින්. චිත්‍රපටියක එක ජවනිකාවක පුටුවක් හැටියට යොදාගන්නා එක, තව ජවනිකාවක පාපුටුවක් හැටියට යොදාගන්න පුළුවන්. තවත් ජවනිකාවක ඒක මේසයක් වෙන්න පුළුවන්. ඒ වගේම දන් චිත්‍රපටිවල තියෙනව දෙබිඩිචරිත රඟපෑමක්. එකම පුද්ගලයා, එකම නළුවා, සමහර විට ජවනිකා කීපයක දෙදෙනෙක් හැටියට පෙනී හිටිනව. මේ භවනාටකයෙත් ඒ විදියේ තත්ත්වයක් තියෙන්නෙ. ඇත්ත වශයෙන් කල්පනා කරල බලනකොට ඥාතීන් වශයෙන් එකිනෙකාට නෑයන් නොවූ කෙනෙකු මේ සංසාරයේ නැතෙයි කියල බුදුපියාණන් වහන්සේ ප්‍රකාශ කළා.

① අපේ මේ ලෝක චිත්‍රයේ, අපේ සමාජධර්ම ආදිය පිළිබඳව යම්කිසි විප්ලවයක් ඇතිවීම වැළැක්වීම සඳහා අපි කල්පනා කරනව මේ නෑ සබඳකම් ඉතාමත්ම ඈත කාලයකට අයිති දේවල් හැටියට. නමුත් ධර්මානුකූලව කල්පනා කරනව නම් -සමහර විට සත්‍යසිද්ධි ආශ්‍රයෙන් උනත් - මවකගෙන් කිරිබොන ළදරුවා හෝ ළදරිය ඒ තැනැත්තියගේම මියගිය පියා හෝ මව හෝ වෙන්න පුළුවන්. අන්න ඒ තරම් පුදුම හාස්‍යජනක තත්ත්වයක් මේ භවනාටකයෙ ජවනිකාවල තියෙනව. මේක ලෝකයාට සාමාන්‍යයෙන් වැටහෙන්නේ නැහැ. හාස්‍යජනක තත්ත්වය නිසා ලෝකයා හිනාවීම නොවෙයි කරන්නෙ. සංවේගය ඇති කර ගැනීමයි. මේ විදියේ දේකට හසු වෙලා සිටිනව නේද කියල. ආශ්‍රව අනුශය ශක්තිය නිසා මේව වැටහෙන්නේ නැහැ නොවේද? ඒ නිසා ක්ලේශ ආදිය

① 'නිවනේ නිවීම' 3 වෙනි වෙළුම 8 වන දේශනය. පිටුව 155

අපි ඇති කර ගන්නව නේද කියල. ඒ විධියටත් සංවේගය ඇතිවෙනව. මේ හැම එකකම ශූන්‍යතාව. අනිමිත්ත වශයෙන්, ඒ වගේම දුක්ඛ වශයෙන් සුඤ්ඤ වශයෙන්, යම්කිසි අවබෝධයක් ලබන්න පුළුවන්.

**① සංස්කාර කියන එක මේ මිහිපිට ජීවත්වන සත්ත්වයාගේ විඤ්ඤාණයේ දැක්වෙන මේ නාමරූප චිත්‍රපටියට - එහෙම නැත්නම් විඤ්ඤාණයේ ගෙතෙන මේ චිත්‍රපටිවලට - මූලිකවන සේයාරූ පටක් වගේ.**

ලෝකයත් එක්තරා විධියක වේදිකාවක් හැටියට ගත්තොත්, මේ ලෝකය අවට තියෙන මේ ගස්කොළං, ඒ වගේම මේ සත්ත්වයින් මේ හැමදෙයක්ම ඇත්තවශයෙන් බලනකොට සිනමා තිරයක දැක්වෙන දේවල් වගේ. නමුත් මෙතන රහස මොකක්ද? මේවායේ සංඛත ස්වභාවය සාමාන්‍ය ලෝකයාට වැටහෙන්නේ නැහැ - මේවායේ තියෙන 'රාමුව.' චිත්‍රපටියක් බලනකොට මේක මේ තිරයේ දැක්වෙන දෙයක් කියන ඒ හැඟීම නැහැ. ඒ අවස්ථාවෙ මේක සත්‍ය දෙයක්, සැබෑ දෙයක් හැටියට පේනව.

② අන්න ඒ ලෝකයේ සැබෑ ස්වරූපය පිළිබඳව බුදුරජාණන්වහන්සේ ප්‍රකාශ කරන්නේ '***ජාතං භූතං සමුප්පන්නං කතං සංඛතමෙවච.***' මේ ලෝකයේ, හට ගත්තු, ඇත්ත දේ හැටියට පෙනෙන දේවල් ඇත්තවශයෙන්ම - '***කතං සංඛතං***'- කරන ලද ගොඩනගන ලද සංස්කාරවලින් සකස් කරන ලද දේවල්ය කියල මේවායේ අසත්‍ය ස්වභාවය අනිත්‍ය, දුඃඛ අනාත්ම ස්වභාවය මෙයිනුත් මතුකරල දෙන්නෙ.

අන්න ඒක නිසා මේ සංස්කාර කියන වචනය ගැන විශේෂයෙන්ම අපට හිතා ගන්න පුළුවනි. එයින් අපට හැඟෙන්නෙ <u>මේ ලෝකයේ ඇති කෘත්‍රිම ස්වභාවය. මේ ලෝකය කෘත්‍රිම දෙයක්</u>

① 'නිවනේ නිවීම' 3 වෙනි වෙළුම 8 වන දේශනය. පිටුව 156
② 'නිවනේ නිවීම' 3 වෙනි වෙළුම 8 වන දේශනය. පිටුව 157



බවට පත් කරන මේ පඨවි ආදී හැම දෙයක්ම සංස්කාර. අන්න ඒ නිසා ඒවායේ අනිත්‍ය ස්වභාවය පිළිබඳ අවබෝධයක් ඇති අර ***අනිදස්සන විඤ්ඤාණය*** ඒවායින් විමුක්තයි. ලෝකයා දැඩිව ගන්නා මේ සංකල්ප වලින් විමුක්තයි. ඒවායේ හොල්මන්වලින් සැලෙන තත්ත්වයක් නැහැ. * * * *

① අපි දනටමත් බොහොම විස්තර කරල තියෙනව - අර සතර මහා භූතයින් - පඨවි ආපො තෙජො වායො, ප්‍රතිෂ්ඨාවක් ලබන්නේ නෑ ඒ විඤ්ඤාණයෙ. හොල්මන් කරන්නෙ නෑ. එතකොට ඒ ටික අපි තේරුම්ගත්ත නම්, ඊළඟට තියෙන ලොකුම ප්‍රශ්නය තමයි ඉරත් හඳත් තරුත් ගැන මේ මොකක්ද ප්‍රකාශකරන්නෙ.

ඒ කියාපු අනිදස්සන විඤ්ඤාණයෙ '***න තත්ථ සුක්කා ජෝතන්ති***' තරු දිළිසෙන්නෙ නැත. ඉරත් ප්‍රකටව බබලන්නෙ නැත. හඳත් එළිය විහිදුවන්නෙ නැත. ඒ වගේම අන්ධකාරයකුත් එතැන නැත. මේව අපි කොහොමද තෝරගන්නෙ?

බුදුපියාණන් වහන්සේ මේ ප්‍රකාශ කරන්නෙ අනන්ත වූ හැම පැත්තෙන්ම ප්‍රභාවත්වූ, ② හැම පැත්තෙන්ම ආලෝකය ඇති - '***අනන්තං සබ්බතෝ පභං***'- අනිදස්සන විඤ්ඤාණයෙ ප්‍රභාවයෙන්, ඒ ප්‍රභාව නිසාම අර කියාපු ඉර හඳ තරු ආදිය නිෂ්ප්‍රභා වන බවයි.

'නිෂ්ප්‍රභා' කියන වචනය සමාජයෙ නම් තියෙන්නෙ ඉහළ උසාවියෙ තීන්දුවකින් පහල උසාවියෙ තීන්දුවක් නිෂ්ප්‍රභා වෙනව වගේ එකක්. එහෙම එකක් නොවෙයි මෙතන. ආලෝකයෙන්මත් නිෂ්ප්‍රභා වෙන ස්වභාවයක් තියෙනව. අපි ඒක අර දේශනා කීපයකදීම එළියට ගත්තු සිනමා දර්ශනයෙන් පැහැදිලි කළා. කෙටියෙන් ආයෙත් සළකල බැලුවොත්, සිනමා දර්ශනයක නරඹන්නන්ගේ අවධානය යොමුවෙලා තිබෙන්නෙ ඒ තිරය මත වැටෙන පටු ආලෝකධාරාව

① 'නිවනේ නිවීම' 5 වෙනි වෙළුම 15 වන දේශනය. පිටුව 326
② 'නිවනේ නිවීම' 5 වෙනි වෙළුම 15 වන දේශනය. පිටුව 327

කෙරෙහියි. ① ඒ නරඹන්නන් අර සිනමාදර්ශනය හැටියට සළකන චිත්‍ර දකින්නෙ ඒ පටු ආලෝකධාරාවත් අවට ඇති ඝන අන්ධකාරයත් පිහිටකරගෙනයි. මේ දෙවෙනි කාරණයත් ඉතා වැදගත්. ඒ රූප පෙනෙන්නෙ අර ආලෝකධාරාව නිසාම පමණක් නොවෙයි. අවට ඇති ඝන අන්ධකාරයත් උපකාර කරගෙනයි.

ඒ බව හෙළිවෙන්නෙ අර ශාලාව ඒකාලෝක උන විටයි. ඒ ශාලාව ඒකාලෝක උනොත් හදිසියෙ දොරකවුළු ඇරීමෙන් හෝ වෙන යම් කිසි ආලෝක ක්‍රමයකින් හෝ, හිටිගමන් ආලෝකවත් වුන හැටියෙ, අර තිරේ මත වැටෙන චිත්‍ර විවර්ණවෙලා මැකිල යනව. අර කලින් වැටුන ආලෝකධාරාව නිෂ්ප්‍රභාවෙනව. ලොකු ප්‍රභාවකින් ඊට අඩු ප්‍රභාවක් නැතිවී යාමයි මේ නිෂ්ප්‍රභා කියන වචනයේ අර්ථය.

දැන් එතකොට ඒ සිනමා දර්ශනය සමහරවිට රුචිනොවන්න පුළුවනි. හැමතිස්සෙම සිනමාව ගැන කථාකිරීම 'නච්ච ගීතවාදිත' හැටියට හිතන්න පුළුවනි. ඒ නිසා අපි කල්පනාකරල බලමු මේ සිනමා දර්ශනය ශාලාවකට සීමාවුන දෙයක්ද කියල.

අප ඇස් ඉදිරිපිට තියෙන ලෝක සිනමාවෙත් මේ විදියෙම දෙයක් සිද්ධවෙනව. මේ විදියෙම නිෂ්ප්‍රභා වීමක් සිද්ධ වෙනව.

හැන්දෑ අහසේ තරු පායාගෙන එනකොට අපි ඒ සහන් එළියෙන් යන්තමින් රූප දකින්න පටන්ගන්නව. අර අන්ධකාරය එන අතරෙ හොඳට තරු පායල තියෙනකොට යන්තමින් අපට රූප පෙනෙන්න පටන් ගන්නව. ටික වෙලාවකින් හඳ පායනවා. එතකොට තරුවලට යන කලදසාව මොකක්ද? තරුවල දීප්තිය මැකිල යනව. තරු නිෂ්ප්‍රභා වෙනව.

① 'නිවනේ නිවීම' 5 වෙනි වෙළුම 15 වන දේශනය. පිටුව 327



ඊළඟට අපි රාත්‍රිකාලයේ හඳේ සෞම්‍ය එළියෙන් සුන්දර ලෝකයක රූප දකිමින් සිටිනව. රැය ගෙවීයනව. ඉර උදාවෙනව. එතකොට මොකද වෙන්නෙ? හඳේ කාන්තිය යනව අර සූර්යයාගේ තේජසින්. හඳ නිෂ්ප්‍රභාවෙනව.

ඊළඟට අපි දවල්කාලයේ නිසැක අඳැමින්ම - ඉර එළිය තියෙනව නම්, අපට සැකයක් නෑ පෙනෙන රූප පිළිබඳව - නිසැක අඳැමින්ම, ප්‍රකට ලෙසම අප අවට තියෙන නොයෙකුත් විචිත්‍ර වෛවර්ණ රූප මේ ලෝක සිනමාවෙ නරඹමින් සිටිනව,

බුදුරජාණන්වහන්සේ වදාළ ආර්යඅෂ්ටාංගික මාර්ගය පුරුදු කරන ආර්යශ්‍රාවක කෙනෙකුගේ චිත්තසන්තානයේ ආගන්තුක ① උපක්ලේශ ඉවත්වෙලා නෛසර්ගික ප්‍රභාස්වරබව මතුවුනා කියල හිතමු. එතකොට මොකද වෙන්නෙ? තරුත් නිෂ්ප්‍රභා වෙනව. හඳත් නිෂ්ප්‍රභා වෙනව. ඉරත් නිෂ්ප්‍රභා වෙනව. තරු එළියෙන්, හඳ එළියෙන්, ඉර එළියෙන් පෙනුන රූපත් විවර්ණ වෙලා මැකිල යනවා. ඒ රූපවලම සෙවනැල්ලක් වන අරූපයත් මැකිල යනව.

**මේ රූපයත් ආකාශයත් චිත්‍රයත් පසුබිමත් වගේ.** එතකොට මේ ඔක්කොම සිද්ධ වෙන්නෙ මේ ආකාශයේ. අර පසුබිමේ. අර සිනමා දර්ශනය අපට ලස්සනට පෙනුනෙ අන්ධකාරය නිසා. ඒ අන්ධකාරයෙ එක එක මට්ටම් තමයි අපි අර තරු එළිය, හඳ එළිය, හිරු එළිය, කියල ප්‍රකාශ කළේ. ලෝකයා හිතන්නෙ හිරුඑළිය ලැබුනහම ඇස් තියෙනව නම් පෙනෙන්ට ඕන කියලයි. ඊට එහාට හිතන්න ශක්තියක් නැහැ.

නමුත් බුදුපියාණන් වහන්සේ ප්‍රකාශ කරල තියෙනව හිරුඑළියටත් වැඩිය ප්‍රභාවත් දෙයක් ලෝකයේ තියෙනව කියලා. '***නත්ථි පඤ්ඤාසමා ආභා***' 'ප්‍රඥාව හා සමාන ආභාවක් නැත' - එතකොට අපිට පේනව අර රූප අරූප මැකිල යන්නෙ මක්නිසාද කියල. මේ

① 'නිවනේ නිවීම' 5 වෙනි වෙළුම 15 වන දේශනය. පිටුව 328

ප්‍රඥාවෙ තියෙනව **'නිබ්බේධිකා පඤ්ඤා'** කියල කියන විනිවිද යන ස්වභාවයක්. රූප පෙනෙනකොට රූපයත් එක්කම එතන හෙවනැලිත් පෙනෙනව. හෙවනැලි පෙනීමෙන්ම පේනව එතැන සම්පූර්ණයෙන්ම අන්ධකාරය දුරුවෙල නැතිබව. **හැම පැත්තෙන්ම ආලෝකයක් වැටෙනව නම් හෙවනැල්ලක් නෑ එතන.** ඒ ආලෝකය විනිවිද යන ස්වභාවයක් ඇති එකක් නම් එතන රූපයක් නැහැ. එතකොට රූපයත් අරූපයත් මුල්කරගෙනයි ලෝකයා සැපදුක් කියල දෙකක් තියන ලෝකයක සැපදුක් විඳින්නෙ.

① යම්කිසි අවස්ථාවක යෝනිසෝමනසිකාරය ආවාම ඒක පිළිබඳව, ඒක්ෂණයෙන්ම - අර ***සන්දිට්ඨික, අකාලික, ඒහිපස්සික*** කියන ධර්මනියාමතාව අනුව-ඒ ක්ෂණයෙන්ම විශාල වෙනසක් සිදුවෙනව. ඒකනිසාම අර අතීතයේ නොයෙකුත් බ්‍රාහ්මණයින් තමතමන්ගේ ධ්‍යාන භාවනා එහෙම කරල බුදුපියාණන් වහන්සේ ළඟට එනව. එක ගාථා පදයක් අහල කොහොමද රහත් වෙන්නෙ කියල සමහර කෙනෙක් කල්පනා කරනව. මේක බුදුපියාණන්වහන්සේගේ ප්‍රාතිහාර්යය නිසාය උනෙ එහෙම නැත්නම් ඒ කාලෙ හිටියෙ පින් ඇති අයය කියල ඒ විදියට තෝරනව. නමුත් මෙතන තියෙන 'ධර්මප්‍රාතිහාර්යය' ගැන කල්පනා කරන්නෙ නැහැ බොහොම අය.

මේ ධර්ම ප්‍රාතිහාර්යය අනුව කල්පනා කරල බැලුවොත් අපට කියන්න පුළුවන්, සමහර කෙනෙක් දේදුන්නක් පායනකං අහස දිහා බලාගෙන ඉන්න පුළුවන්. මේක ඉතින් කොච්චර කාලයක් බලං ඉන්න වෙනවද දන්නෙ නැහැ. නමුත් ප්‍රඥාවන්තව - උදෑසන අර වැලක කොලයක එල්ලෙන පිණිබිඳක් ඔස්සේ ඉරපායනකොට හරියට ඉලක්කය අල්ලල බැලුවොත් සූර්යරශ්මියේ තියෙන සියලුම වර්ණ සංකලන ඒ පිණිබිංදුව තුළින් දකින්න පුළුවන් වෙනව,

---

① 'නිවනේ නිවීම' 3 වෙනි වෙළුම 9 වන දේශනය. පිටුව 189



යොනිසොමනසිකාර, අයොනිසොමනසිකාර කියන වචන දෙක දිහා බැලුවාම, ① ශාස්ත්‍රීය වශයෙන් බැලුවාම, අහසට පොළොව වගේ පරතරය. සම්මාදිට්ඨි, මිච්ඡාදිට්ඨි කියන වචනදෙක බැලුවාම අහසට පොළොව වගේ පරතරය. ඇතයි. නමුත් ප්‍රත්‍යක්ෂවශයෙන් කල්පනාකරල බලනකොට, ඉතාම සුළු වෙනසයි තියෙන්නෙ.

පිණිබිඳක ෂඩ්වර්ණය, කෙනෙකුට ඉතාමත්ම පහසුවෙන් ප්‍රත්‍යක්ෂකරගත හැකි දෙයක්. සමහරවිට අපට ඉබේමත් පේනව ඉර පායාගෙන එනකොට. ඉතාමත්ම සුළු වෙනසක් කළ හැටියෙ අර පිණිබිඳේ තියෙන වර්ණසංකලනය නොපෙනී යනව. ඒක පෙනෙන්නෙ එක්තරා ඉලක්කයකට බැලුවාම පමණයි. ඔන්න ඔය විදියෙ දෙයක් තියෙන්නෙ මේ ධර්මය පිළිබඳවත්. **සන්දිට්ඨික, අකාලික, ඒහිපස්සික, ඕපනයික, පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහි** ධර්මයේ ස්වභාවය ඕකයි.

② මීට කලින් දේශනයකදී අපි උපමාවක් හැටියට දැක්වුව 'උදෑසන හිරු රැසේ දිලෙන දිලිසෙන පිණි බිඳුවක්.' බොහොම පොඩි උපමාවක්. වැලක හෝ කොළයක හෝ එල්ලෙන ඉතා කුඩා පිණිබිඳුවක් තුළින් සූර්යයාගේ දේදුනු වර්ණ සංකලනය දැකීම ඉතාමත්ම සීරුවෙන් කළයුත්තක්. සූර්යයාට මූනදාල හිටගත්තු පමණින්, එහෙම නැත්නම් ඉඳගත්තු පමණින්, ඒ පිණි බිඳුව තුළින් සූර්යයාගේ ෂඩ්වර්ණය, ඒ දේදුනුවර්ණ සංකලනය, දකින්න බැහැ. ඒ සඳහා යම්කිසි දෘෂ්ටිකෝණයක් ඕන. නියම දෘෂ්ටිකෝණය අනුව හරියට නිසි එල්ලය අල්ලල බැලුවොත් තමයි අර පිණිබිඳුව තුළින් දේදුනු වර්ණය දකින්න පුළුවන් වෙන්නෙ.

---

① 'නිවනේ නිවීම' 3 වෙනි වෙළුම 9 වන දේශනය. පිටුව 190
② 'නිවනේ නිවීම' 5 වෙනි වෙළුම 15 වන දේශනය. පිටුව 330-331

දේදුන්නක් පායනකම් ඉන්න ඕනෙත් නැහැ. පිණි බිඳුව තුළින් දකින්න පුළුවන් දේදුනු වර්ණය. හැබැයි හරි දෘෂ්ටිකෝණයෙන් පමණයි.

① මේ විදියටම බුදුපියාණන්වහන්සේගේ සද්ධර්මයෙහි ෂඩ්වර්ණය, අර ස්වාක්ඛාතාදි ෂඩ්වර්ණය, දකීමටත් යම්කිසි දෘෂ්ටිකෝණයක් තිබෙනව. ඒක තමයි සම්මා දිට්ඨිය. එතකොට මේ සම්මාදිට්ඨිය සෘජුකරගැනීමට මේ ගැඹුරු සූත්‍රවල අර්ථ ප්‍රත්‍යවේක්ෂාවත් උපකාර වෙනව. ගම්භීර සූත්‍රාර්ථ ප්‍රත්‍යවේක්ෂාව මේ සම්මාදිට්ඨිය හරිගස්සගන්න උපකාර වෙනව. සම්මාදිට්ඨිය නැති තැන ශීලය සීලබ්බතයට නැඹුරු වෙනව. සමාධිය මිච්ඡා සමාධියට ඇදිල යනව.

② ඇත්ත වශයෙන්ම සමහරවිට කෙනෙක් හිරුදෙසට මූනලා ඉඳගත්තවගේ බුදුපියාණන්වහන්සේගේ ධර්මය දිහාවට හැරිල හිටියත්, සරණගමන මාත්‍රයෙන් ලැබෙන දායාදයක් නොවෙයි සම්මාදිට්ඨිය. උත්සාහයෙන් සැළකිල්ලෙන් දියුණුකර ගතයුතු දෙයක්. කෙලින් කරගතයුතු දෘෂ්ටියක්. **'දිට්ඨුජ්ජුකම්ම'** කියල කියන්නෙ.

කොයිතරම් කාලයක් බද්ධ පර්යංකයෙන්ම මේ බුද්ධසූර්යයා දෙස බලාගෙන හිටියත් සමහරවිට කෙනෙකුට අර ධර්මයේ ෂඩ්වර්ණය දකින්න බැහැ. නියම දෘෂ්ටිකෝණය සමහරවිට අහලකින් සියයකින් කොටසක් වෙන්න පුළුවන්. නමුත් ඒක අත්‍යවශ්‍ය දෙයක්. අත්‍යවශ්‍ය වෙනසක්. ඒ වෙනස කළා නම් එකෙණෙහිම - **'තාවදේව'**- අර බාහිය රහතන්වහන්සේ වගේ - බුදුපියාණන් වහන්සේ දේශනා කළ ධර්මයෙ ෂඩ්වර්ණය දකිනව.

---

① 'නිවනේ නිවීම' 5 වෙනි වෙළුම 15 වන දේශනය. පිටුව 330
② 'නිවනේ නිවීම' 5 වෙනි වෙළුම 15 වන දේශනය. පිටුව 331



# වෙනත් කෘති

1. Concept and Reality in Early Buddhist Thought -(1971)*
2. Samyutta Nikaya - AnAnthology, Part II - Wheel No, 183/185 -(1972)*
3. Ideal Solitude - Wheel No, 188 - (1973)*
4. The Magic of the Mind - (1974)*
5. උත්තරීතර හුදෙකලාව -'දම්සක්' අංක 172/173 - (1990)*
   -එම- (නව මුද්‍රණය), ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය (2001)
6. Towards Calm and Insight - (1991)
7. විදසුන් උපදෙස් - (1996)
8. නිවනේ නිවීම - (1997-2004)
   -ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය, මහා භාරකාර දෙපාර්තමේන්තුව
   (සම්පූර්ණ පොත වෙළුම් 11 කින් නිකුත් වී ඇත.)
9. From Topsy - turvydom to Wisdom -Volume 1 - (1998)
   (Essays written for 'Beyond the Net, - A website on the Internet
   - Website address http:// www.beyond thenet.net)
10. පහන් කණුව ධර්ම දේශනා - 1- වෙළුම - (1999)
11. Seeing Through - (1999)
12. හිතක මහිම - 1 - (1999)
13. නිවනේ නිවීම - ප්‍රථමභාගය - (1-6 වෙළුම්) - පුස්තකාල මුද්‍රණය(2000)
14. හිත තැනීම - (2000)
15. පහන් කණුව ධර්ම දේශනා - 2 වෙළුම - (2000)
16. Towards A Better World -Translation of 'Lo-wada-Sangarava' - (2000)
17. පැවැත්ම හා නැවැත්ම - (2000)
18. ඇති හැටි දැක්ම - (2001)
19. පහන් කණුව ධර්ම දේශනා - 3 වෙළුම - (2001)
20. දිවි කතරේ සැඳෑ අඳුර - (2001)
21. කය අනුව ගිය සිහිය - (2001)
22. මා-පිය උවැටන - (2002)
23. ප්‍රතිපත්ති පූජාව - (2003)
24. Nibbana - The Mind Stilled - Volume I - (2003)
25. පහන් කණුව ධර්ම දේශනා - 4 වෙළුම - (2003)
26. අභිනික්මන - (2003)
27. හිතකමහිම - 2 - (2003)
28. පහන් කණුව ධර්ම දේශනා - 5 වෙළුම (2005)
29. පහන් කණුව ධර්ම දේශනා - 6 වෙළුම (2006)
30. Nibbana - The Mind Stilled - Volume II - (2005)
31. Nibbana - The Mind Stilled - Volume III - (2005)
32. Nibbana - The Mind Stilled - Volume IV - (2006)
33. Nibbana - The Mind Stilled - Volume V - (2007)
34. The Magic of the Mind - (2007)

* Buddhist Publication Society, P.O. Box, 61, Kandy
බෞද්ධ ග්‍රන්ථ ප්‍රකාශන සමිතිය, තැ.පෙ. 61, මහනුවර

## ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය මගින් පළකරන ලද ග්‍රන්ථ

| | ග්‍රන්ථ නාමය | | පිටපත් සංඛ්‍යාව |
|---|---|---|---|
| 01. | නිවනේ නිවීම | පළමු වෙළුම | 11000 |
| 02. | නිවනේ නිවීම | දෙවන වෙළුම | 8000 |
| 03. | නිවනේ නිවීම | තෙවන වෙළුම | 5000 |
| 04. | නිවනේ නිවීම | සිවුවන වෙළුම | 6000 |
| 05. | නිවනේ නිවීම | පස්වන වෙළුම | 5000 |
| 06. | නිවනේ නිවීම | සයවන වෙළුම | 3500 |
| 07. | නිවනේ නිවීම(පුස්තකාල මුද්‍රණය) | ප්‍රථම භාගය(1-6 වෙළුම්) | 500 |
| 08. | නිවනේ නිවීම | සත්වන වෙළුම | 3000 |
| 09. | නිවනේ නිවීම | අටවන වෙළුම | 3000 |
| 10. | නිවනේ නිවීම | නවවන වෙළුම | 5000 |
| 11. | නිවනේ නිවීම | දසවන වෙළුම | 5000 |
| 12. | නිවනේ නිවීම | එකොළොස්වන වෙළුම | 3000 |
| 13. | පහන් කණුව ධර්ම දේශනා | පළමු වෙළුම | 9000 |
| 14. | පහන් කණුව ධර්ම දේශනා | දෙවන වෙළුම | 8000 |
| 15. | පහන් කණුව ධර්ම දේශනා | තෙවන වෙළුම | 6000 |
| 16. | පහන් කණුව ධර්ම දේශනා | සිවුවන වෙළුම | 7000 |
| 17. | පහන් කණුව ධර්ම දේශනා | පස්වන වෙළුම | 6000 |
| 18. | පහන් කණුව ධර්ම දේශනා | සයවන වෙළුම | 4000 |
| 19. | 'හිතක මහිම' | පළමු වෙළුම | 8000 |
| 20. | 'හිතක මහිම' | දෙවන වෙළුම | 5000 |
| 21. | උත්තරීතර හුදෙකලාව | | 8000 |
| 22. | විදසුන් උපදෙස් | | 5000 |
| 23. | චලන චිත්‍රය | | 3000 |
| 24. | Towards A Better World | | 6000 |
| 25. | Seeing Through | | 3000 |
| 26. | Nibbana - The Mind Stilled | Volume I | 3000 |
| 27. | Nibbana - The Mind Stilled | Volume II | 3000 |
| 28. | Nibbana - The Mind Stilled | Volume III | 3000 |
| 29. | Nibbana - The Mind Stilled | Volume IV | 1000 |
| 30. | Nibbana - The Mind Stilled | Volume V | 2000 |
| 31. | The Magic of the Mind | | 2000 |

නැවත මුද්‍රණය කරවීම පිළිබඳ විමසීම් :-
ජී. ටී. බණ්ඩාර, ස්ථාපක, ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය
රෝයල් ඉන්ස්ටිටියුට්, 191, හැව්ලොක් පාර, කොළඹ 5.
දු.ක. - 0112-508173, 2592747 - 48